


LANKACOAL
COMPANY(PVT)LTD



ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම
வரையறுக்கப்பட்ட இலங்கை நிலக்கரி (தனியார்) நிறுவனம்
Lanka Coal Company (Pvt) Ltd.

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
Annual Report 2020

www.lankacoal.lk

ස්ථාපිත කිරීම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම 2006 වර්ෂයේ දී
අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මත
2008 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර
2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදි.

දැක්ම

ශ්‍රී ලංකාව තුළ අබණ්ඩව බලශක්තිය සැපයීමට සහතික කරනු පිණිස ශ්‍රී ලංකාව
තුළ පිහිටා ඇති ගල්අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා
ගල්අඟුරු අවශ්‍ය ගුණාත්මක භාවයෙන් සහ ප්‍රමාණයෙන්, කාර්යක්ෂමව සහ
ක්‍රියාශීලීව අවම පිරිවැයකින් ප්‍රසම්පාදනය කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගල්අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා
ගල්අඟුරු අවශ්‍ය ප්‍රමාණයෙන් සාධාරණ මිළකට ප්‍රසම්පාදනය කිරීම.
ගල්අඟුරු අළු භාවිතා කොට නව නිෂ්පාදන හඳුන්වා දෙමින්
පරිසර හිතකාමී ගල්අඟුරු අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධති ක්‍රියාත්මක කිරීම.
කර්මාන්තකරුවන්ගේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකයද වඩාත් ශක්තිමත් කිරීමේ
විකල්ප බලශක්ති ප්‍රභවයන් ලෙස ඔවුන් වෙත ගල්අඟුරු හඳුන්වාදීම.

පටුන

ආයතනික තොරතුරු	04
සභාපතිතුමාගේ පණිවිඩය	05
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	08
අවදානම් කළමනාකරණය	10
කාර්යසාධන සමාලෝචනය	12
අනාගත උපායමාර්ගික සැලසුම්	18
විගණකාධිපති වාර්තාව	20
විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ	27
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	35
මූල්‍ය කාර්යසාධනය සහ අනිකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	37
සමකොටස්වල වෙනස්වීමේ ප්‍රකාශනය	38
මුදල් ගැලීමේ ප්‍රකාශනය	39
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	41

ආයතනික තොරතුරු

සමාගමේ නම	:	සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
සමාගම ලියාපදිංචි කිරීමේ අංකය	:	පීවී 62636
නෛතික ආකාරය	:	2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සීමිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි. අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මගින් ස්ථාපනය කරන ලද පූර්ණ වශයෙන් රජය සතු ව්‍යාපාර කළමනාකරණය කරනු ලබන සමාගමකි.
ලියාපදිංචි කාර්යාලය	:	අංක 51/13, සුරනිමල පෙදෙස, Off Dutugemunu Street, කොහුවල, දෙහිවල, ශ්‍රී ලංකාව. දු.ක. +9411 2824681/2 ෆැක්ස් +94112824689 විද්‍යුත් තැපෑල consec@lankacoal.lk වෙබ් අඩවිය www.lankacoal.lk
පරිපාලක සමාගම	:	ලංකා විදුලිබල මණ්ඩලය අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
සමාගම් ලේකම්වරු	:	සීමාසහිත පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම අංක 3/17, කිංසි පාර, කොළඹ 08.
විගණකවරු	:	විගණකාධිපති ජාතික විගණන කාර්යාලය, 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.
බැංකුකරුවෝ	:	මහජන බැංකුව - ආයතනික ශාඛාව ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව - හයිඩ් පාර්ක්

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

2020 න් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අපි සතුටට පත්වෙමු. ලංකා ගල්අඟුරු සමාගමේ සභාපති ලෙස මම 2020 වර්ෂයේ සිට කටයුතු කරමි. එවක් පටක් මේ දක්වා ලංකා ගල්අඟුරු සමාගමේ පැවැති අවිධිමත් ක්‍රම විධිමත් කිරීමට ගරු අමාත්‍යතුමාගේ මෙන්ම ලේකම්තුමාගේ මගපෙන්වීම යටතේ මට හැකිවූ අතර, එමගින් විශාල ප්‍රගතියක් අත්පත් කරගැනීමටත්, සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් නායකත්වයක් ලබාදීමටත් හැකිවූ බව මම සතුටින් අවධාරණය කරමි.

ලංකා ගල්අඟුරු සමාගම 2008 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබුවේ මෙ.වො. 900 ක ධාරිතාවකින් යුත් දිවයිනේ මූලික බලශක්ති මූලාශ්‍රය වන නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය මඟින් ජාතික බලශක්ති ජාලකය වෙත අඛණ්ඩ ගල්අඟුරු සැපයීමට සහතික කරනු පිණිස ය. එයට මෙ.වො. 300 ක ධාරිතාවකින් යුත් බලාගාර තුනක් ඇත. එබැවින් අවශ්‍ය ප්‍රමාණයෙන් ගල්අඟුරු කලට වේලාවට සැපයීම විශාල වගකීමක් වන අතර එසේ නොවුව හොත් එමගින් ජාතික ආර්ථිකයට මෙන්ම ජනතාවගේ එදිනෙදා ජීවිතයට සුවිශේෂී බලපෑමක් ඇතිවිය හැකිය.

එබැවින් ලංකා ගල්අඟුරු සමාගම විසින් සිදුකරනු ලබන ජාතික මෙහෙවරට නායකත්වය ලබාදෙමින් එහි සභාපති වශයෙන් මෙම භාරදූර වගකීමට උරදීමට හැකිවීම සහ මා ලද වරප්‍රසාදයක් ලෙස මම සලකමි. එසේම මාගේ වෘත්තීය ජීවිතයේ සැතපුම් කණුව වූයේ ලංකා ගල්අඟුරු සමාගම ස්ථාපනය කළ දින සිට දශකයකටක් වැඩි කාලයක අක්‍රීය තත්ත්වයේ නොතිබූ පහත සඳහන් ක්‍රියාකාරකම් අනුකූලනය කරමින් ප්‍රමිත ක්‍රම අනුගමය කිරීම ස්ථාපනය කිරීම ය.

ඒ අනුව, අසම්පූර්ණ වාර්ෂික වාර්තා සම්පූර්ණ කොට අනුමැතිය සඳහා බලශක්ති අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩලය ඉදිරිපත් කරනු ලැබීය. ඒවා බොහෝ දුරට අනුකූලනය කිරීමේදී සාර්ථක වී ඇත. ලංකා ගල්අඟුරු සමාගමේ ප්‍රධාන කාර්යය වන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම, ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමැතියට යටත්ව කාර්යමණ්ඩලයට වැටුප් ගෙවීමේ සම්මත ක්‍රමයක් ස්ථාපනය කිරීම, ලංකා ගල්අඟුරු සමාගම සහ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද සේවකයින් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ සහ ආයතනික ණය සහන සඳහා සම්මත ක්‍රියාපටිපාටියක් සකස් කිරීම, සියලුම ලංසු ලේඛන සහ ගිවිසුම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් නෛතික අනුමැතිය ලබාගැනීම, ටෙන්ඩර් කැඳවීමට පෙර මූලික සැලසුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, ප්‍රසම්පාදන අත්පොත සහ අභ්‍යන්තර පාලන මාර්ගෝපදේශ නීති සංග්‍රහය වැනි ක්ෂේත්‍රවල සම්පත ක්‍රියාපටිපාටීන් හඳුන්වාදීම සහ අනුකූලනයවීම ආදිය ඒ අතර ප්‍රධාන වේ.

විශේෂයෙන්ම පසුගිය ගල්අඟුරු වාරය තුළ ලොව පුරා පැතිර ගිය කොවිඩ්-19 වසංගතය නිසා අපට ගල්අඟුරු සැපයූ දකුණු අප්‍රිකාවේ RBCT වරාය සම්පූර්ණයෙන්ම වසා දමනු ලැබීය. එම අවස්ථාවේදී අප විසින් සිදුකරන ලද පූර්ණ මැදිහත්වීම මත අදාල විදේශීය මහ කොමසාරිස් කාර්යාල සමඟ ඇතිකළ සම්බන්ධීකරණය නිසා කිසිඳු අඩුවක් නොමැතිව අවශ්‍ය ගල්අඟුරු ලබාගැනීමට අපට හැකිවිය. තවද 2020-21 වාරය සඳහා CFR පදනම මත spot tenders කැඳවීම මඟින් අපට එක්සත් ජනපද ඩොලර් මිලියන 3.5 ක ලාභයක් අපට උපයාගත හැකි විය.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම සංකල්පයට අනුගතව බහුතර පිරිසකගේ සහයෝගය ඇතිව අක්‍රීය සහ අභාවයට ගොස් තිබූ සමහර යහපාලන ක්‍රියාවලි කිහිපයක් විධිමත් කිරීමට සම්පූර්ණ දායකත්වය ලබාදීමට ලංකා ගල්අඟුරු සමාගමේ පසුගිය වර්ෂයේ සභාපති වශයෙන් මට හැකිවිය.

මෙම අරමුණු විවිධ මාර්ගවලින් සාක්ෂාත් කරගැනීමේදී මට උපකාර කළ ගරු අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමාට, ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට, මූල්‍ය කළමනාකාරතුමාට, ප්‍රසම්පාදන කළමනාකාතුමාට සහ කාර්යමණ්ඩලයේ අනිකුත් සියලුම දෙනාට මාගේ කෘතඥතාවය පලකිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ

සංයුක්ත පාලනය

"සංයුක්ත පාලනය" යනු අයිතිවාසිකම් හා වගකීම් යටත් වන නීති, ක්‍රියාවලි හෝ රෙගුලාසිවලට අනුව ඒවා විවිධ සංස්ථාපිත ආයතන අතර බෙදාහරිනු ලබන ක්‍රම විස්තර කරන ප්‍රජාතීය පදයකි. ප්‍රායෝගිකව, සංයුක්ත පාලනය - හිමිකරුවන් සෘජුව හෝ වක්‍රව තීරණ ගැනීමේ පද්ධතිය සහ සමාගම පාලනය කරන ව්‍යුහය මගින් අර්ථ දක්වනු ලැබේ. ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ සියලුම ක්‍රියාකාරකම්වල ව්‍යාපාරික අවංකකම සහ වෘත්තීය දක්ෂකම සුරක්ෂිත කිරීම වෙනුවෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. මෙම කැපවීමේ කොටසක් ලෙස, විනිවිදභාවය, පාලනය සහ වගවීම අවධාරණය කරන පොදුවේ පිළිගත් ප්‍රතිපත්ති වැඩරාමුවක් පදනම් කරගෙන සමාගම තුළ යහ පාලන පරිචයන් පූර්ව-ප්‍රතික්‍රියාකව උද්යෝගීමත් කිරීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

කොටස්කරුවන්, රජය සහ විය මෙහෙයවන සමාජය වෙනුවෙන් තමන්ගේ වගකීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටින අතර සමාගමේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යාමේදී ආචාරධර්මීය පවැත්මක් ඉසිලීමට ඉතා පැහැදිළිව කැපවී සිටී. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට හා අමාත්‍යාංශයේ අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

2020 දෙසැම්බර් 31 දිනට කාර්යාල දැරූ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් පහත දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය

- **බී.කේ.ජේ.කේ. පෙරේරා මහතා** - සභාපති (2020.02.11 දින සිට)
- **ඩබ්ලිව්.සී. ජයසිංහ මෙය** - අධ්‍යක්ෂක (2020.02.11 දින සිට)
- **එස්.ඩබ්ලිව්. මදනායක මහතා** - අධ්‍යක්ෂක (2020.01.27 දින සිට)
- **එන්.ඩබ්ලිව්.කේ. හේරත් මිය** - අධ්‍යක්ෂක (2020.12.07 දින සිට)
- **ආචාර්ය ප්‍රසන්ත ජයමාන්න මහතා** - අධ්‍යක්ෂක (2020.10.01 දින සිට)
- **ඒ.ආර්. නවමනි මහතා** - අධ්‍යක්ෂක (2020.12.07 දින සිට)

වර්ෂය තුළදී සමාගම සමග කිසිඳු සෘජු හෝ වක්‍ර කොන්ත්‍රාත්තුවකට එළඹීමට අධ්‍යක්ෂ මණ්ඩලයට කැමැත්තක් නොතිබුණි. එකී කාලපරිච්ඡේදය සඳහා සමාගමේ කටයුතුවල තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ අදහසක් ලබාදෙන ඒ ඒ මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ප්‍රකාරව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒ සඳහා යෝග්‍ය ගිණුම් පිළිවෙත් තෝරාගෙන ඒවා නිත්‍ය සහ සාධාරණ ලෙ අදාල කරගෙන ඇති අතර ඥානාන්විත විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදුකර ඇත. අදාල ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කර ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල විස්තර කර ඇත.

සෑමවිටම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට යුක්තිසහගත ක්‍රියාමාර්ග ගනු ලබන බවට සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවය යුතු ය. මෙම සංදර්භය තුළ, වංචා සහ අනිකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ සොයා ගැනීම පිණිස ඔවුන් විසින් යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කර ඇත.

ගිණුම් පිළියෙල කිරීමේදී අඛණ්ඩභාවය යොදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත. සමාගමේ අයවැය සහ ණය ගැනීමේ පහසුකම් සමාලෝචනය කිරීමෙන් පසුව සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකරගෙන යාම පිණිස ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලද දිනයන්

01. 2020.02.19
02. 2020.04.29
03. 2020.06.10
04. 2020.07.20
05. 2020.08.27
06. 2020.09.28
07. 2020.12.04

මූල්‍ය සහ මෙහෙයුම් යන විගණනවලට දෙකටම පසුව නිකුත් කරනු ලබන විගණකාධිපතිගේ වාර්තාවේ අභිතකර සටහන් අන්තර්ගතව තිබුණි. අපි මෙහෙයුම් පිළිබඳව කතා කළොත්, ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය, සැපයුම්කරුවන් සඳහා සිදුකරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් කිසිඳු උනන්දුවක් නොමැති

සංයුක්ත පාලනය

කළමනාකරණ පාලනය, තත්ත්ව පාලන/තත්ත්ව මිළ ගැලපීම්, විනිවිදභාවය සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් අසාර්ථක ලංසුකරුවන් විසින් නිතර නිතර ගනු ලබන නෛතික ක්‍රියාමාර්ග ආදිය සමාගමට වැඩි වශයෙන් කටයුතු කිරීමට සිදුව තිබූ ගැටළු ය. මෙම කරුණුවලින් බොහෝමයක් විගණන වාර්තාවල ඉස්මතු කර පෙන්වා තිබුණි. කෙසේ වෙතත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය විශාල ප්‍රමාණයකට විනිවිදභාවයෙන් සිදුකර ඇති බවට අපි සතුටින් සඳහන් කරන අතර කාලපරිච්ඡේදය සඳහා තරක්කුරු ලංසුකරුවන් අතර ටෙන්ඩර ප්‍රදානය කිරීමට අදාලව ප්‍රතිවාදක ගැටළු නොතිබුණි. තවදුරටත්, සියලුම විගණන වාර්තාවලට අපවිසින් ක්ෂණිකව ප්‍රතිචාර දක්වා ඇති අතර ඒවායේ අන්තර්ගත අඩුලුහුඬුකම් නිවැරදි කිරීමට ලබාදී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කළෙමු. ඒ අනුව මේ වනවිට අප වෙත නොලැබණු විගණන වාර්තා නොමැති බවට ස්ථිරව සඳහන් කරමු.

අනුකූලවීම පාලනයේ වැදගත් ලක්ෂණයකි. ව්‍යවස්ථා සමග අනුකූලවීම සහතික කිරීම පිණිස කළමණාකරනය විසින් විශේෂ අවධානය යොමුකර ඇත.ඒ අනුව ආදායම්, බදු, වැට් වැනි බදු, සේ.අ.අ., සේ.නි.භා.අ. සඳහා ගෙවීම් සියල්ල සමාගම විසින් ගෙවා ඇති අතර වර්ෂය සඳහා විධිමත්ව සම්පූර්ණ කරන ලද වාර්තා සපයා ඇත. අතීත හිඟව පවතින අදායම් බදු පියවීම පිණිස දේශීය අදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ මේ වනවිට සාකච්ඡා කරමින් සිටිමු.

රේඛීය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට (AMC) සමාගම ක්‍රියාකාරිව සහභාගි වේ. විගණන වාර්තාවලට අප විසින් ප්‍රතිචාර දක්වා ඇති අතර නිකුත් කර තිබූ නිර්දේශ හැකි තාක් දුරට ක්‍රියාත්මක කර ඇත.

විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට (AMC) පවත්වන ලද දිනයන්

01. 2020.02.24
02. 2020.12.23

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාව එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතුටින් ඉදිරිපත් කරමු.

සමාගමේ කටයුතු සම්බන්ධයෙන් මෙම වාර්ෂික වාර්තාවේ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 වෙනි වගන්තිය ප්‍රකාරව අවශ්‍ය කරනු ලබන තොරතුරු සහ සමහර අමතර තොරතුරු අන්තර්ගත වේ.

සමාගමේ සහ පරිපාලිත සමාගම්වල මූලික ක්‍රියාකාරකම් සහ වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචනය

වර්ෂය තුළ නොවෙනස්ව පවතින සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් (ල.ං.වි.බ.ම.) නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ප්‍රමාණීකෘත ගල්අඟුරු ආනයනය කොට සැපයීමේ ව්‍යාපාරයයි. ප්‍රමාණීකෘත ගල්අඟුරු යනුවෙන් අදහස් කරන්නේ, ආනයනය කොට සපයනු ලබන ගල්අඟුරු ගැනුම්කරු (ලංවිබම) විසින් නියම කරනු ලබන විශේෂිත තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල ගල්අඟුරු වීමය.

මූල්‍ය ප්‍රකාශන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් එහි අධ්‍යක්ෂකවරුන් වන බී.කේ. ජගත් කුමාර පෙරේරා මහතා සහ එන්.ඩබ්ලිව්.කේ. හේරත් මෙය යන දෙපළ විසින් විධිමත්ව අත්සන් කර ඇත.

විගණකාධිපතිගේ වාර්තාව

සමාගමේ මූල්‍ය විගණනය සිදුකරනු ලබන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාව විගණනය සම්පූර්ණ කළ පසුව ලබාගත හැකිය.

ගිණුම් පිළිවෙත්

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කොට ඇති අතර එහිදී යොදා ගන්නා ලද ගිණුම් පිළිවෙත් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 07 සිට 14 යටතේ සඳහන් කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය 2,000,000 ක සාමාන්‍ය කොටස් නියෝජනය කරමින් රු 20,000,000 ක් විය.

අධ්‍යක්ෂකවරුන්

2020 දෙසැම්බර් 31 දිනට කාර්යාල දැරූ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් පහත දැක්වේ.

- **බී.කේ.ජේ.කේ. පෙරේරා මහතා** **සභාපති** (2020.02.11 දින සිට)
- **ඩබ්ලිව්.සී. ජයසිංහ මෙය** (2019.11.28දින සිට)
- **එන්.ඩබ්ලිව්.කේ. හේරත් මිය** (2020.12.07 දින සිට)
- **එස්.ඩබ්ලිව්. මදනායක මහතා** (2020.01.27 දින සිට)
- **ආචාර්ය ප්‍රසන්ත ජයමාන්න මහතා** (2020.10.01 දින සිට)
- **ඒ.ආර්. නවමනි මහතා** (2020.12.07 දින සිට)

2020 වර්ෂයේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සිදුකරන ලද වෙනස්කම්:

- **යූ.කේ. දේවසුරේන්ද්‍ර මහතා** **සභාපති** (2019.01.30 සිට 2020.02.11 දක්වා)
- **කපිතාන් ඒ. හේවාවිතාරණ මහතා** (2017.06.01 සිට 2020.03.02 දක්වා)
- **එස්.ඩී.ඩබ්ලිව්. ගුණවර්ධන මහතා** (2019.01.30 සිට 2020.01.25 දක්වා)
- **ඩී.ජේ.පී.එස් එදිරිසිංහ මහතා** (2019.01.30 සිට 2020.02.11 දක්වා)
- **ඩී.ඩී.කේ කරුණාරත්න මහතා** (2020.01.28 සිට 2020.12.06 දක්වා)
- **සී.ජේ.පී රණතුංග මහතා** (2020.02.25 සිට 2020.09.28 දක්වා)
- **ඒ.එම්.ඒ.ඒ.එල් රත්නායක මහතා** (2020.03.02 සිට 2020.09.30 දක්වා)
- **පී.එල්.පී කාරියවසම් මහතා** (2019.05.22 සිට 2020.04.20 දක්වා)
- **එච්.එම්.ඒ හේරත් මහතා** (2020.04.24 සිට 2020.12.07 දක්වා)

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

වර්ෂය තුළ සමාගම සමඟ කිසිදු කොන්ත්‍රාත්තුවකට සෘජුව හෝ වක්‍රව එළඹීමට අධ්‍යක්ෂකවරුන්ට බැඳියාවක් නොතිබිණ. සමාලෝචිත හිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගම සමඟ පැවැති සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 22 හි දක්වා ඇත.

අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික

සභාපති/කළමනාකර අධ්‍යක්ෂකගේ පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශන සඳහා අමතර සටහන "ඈ" , පිටු අංක 24, පරිපාලන වියදම් යටතේ අනාවරණය කර ඇති අතර අධ්‍යක්ෂකවරුන් සඳහා ගාස්තුද ඉහත පරිදිම අමතර සටහන් "ඈ" හි සඳහන් කර ඇත.

පරිත්‍යාග

සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් කිසිදු පරිත්‍යාග යක් සිදුකර නොමැත.

දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සංචලනවලට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 10 හි දක්වා ඇත.

සංචිත

2020 දෙසැම්බර් 31 දිනට සමාගම සතු සංචිතවල වටිනාකම රු.මි. 106.97 ක් ලෙසට ගණන් බලා ඇත. එහි සංචලනය මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 03 හි දක්වා ඇත.

සේවානියුක්තිය

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ සේවානියුක්තිය පුද්ගලයින් 23 ක් විය.

බැඳීම් සහ සම්භාව්‍යතා

2020 දෙසැම්බර් 31 දිනට බැඳීම් සහ සම්භාව්‍යතා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 24 හි දක්වා ඇත.

විගණකවරුන්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනවන ලද 19 වෙනි සංශෝධනයේ 154(1) වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදන ප්‍රකාරව විගණකාධිපති විසින් විගණනය කරනු ලදි.

සමාගම සඳහා බදු අනුකූලතා සේවාවන් කන්සල්ටන්ට් කොන්සෝටියම්, වරලත් ගණකාධිකාරිවරුන් විසින් සපයන ලදි.
විගණකගේ කාර්යය හැර සමාගම සම්බන්ධයෙන් විගණකවරුන්ට කිසිදු බැඳියාවක් නොමැත.

සමාගම	විගණකගේ/බදු උපදේශකගේ නම	ගෙවීම් වර්ගය	මුදල රු.
සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික සමාගම)	විගණකාධිපති	විගණන ගාස්තු + ප්‍රතිපූරණය කළ යුතු වියදම් (බදු හැර)	දැනුම්දී නොමැත
	කන්සල්ටන් කොන්සෝටියම්, වරලත් ගණකාධිකාරිවරුන්	ආදායම් බදු ගණනය කිරීම සහ වාර්තා කිරීම	45,000.00

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනවන ලද 19 වෙනි සංශෝධනයේ 154 වෙනි වගන්තියට අනුකූලව මූල්‍ය වර්ෂය සහතික කිරීමේ විගණකවරයා ලෙස විගණකාධිපති පත්කරනු ඇත.

මෙම වාර්ෂික වාර්තාවට අධයක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති සහ අධ්‍යක්ෂකවරුයෙකු විසින් අත්සන් තබනු ලැබේ.

සභාපති අධ්‍යක්ෂ

පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරු

අවදානම් කළමනාකරණය

i) වෙළඳපොල අවදානම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ගල්අඟුරු මිළ සම්බන්ධ වෙළඳපොළ අවදානමට අනාවෘත ය. කෙසේ වෙතත් මෙම අනාවරණය විවෘත අවදානමක් ලෙසත් එය අඩුවන අනාවරණයක් ලෙසත් අපි අර්ථ දක්වමු. පළමුවෙන්ම සියලුම ටෙන්ඩර් එම අවස්ථාවේදීම සහ නියමයන් යන දෙකම (both spot and term) තරඟකාරී ලංසු තැබීම පදනම් කරගෙන සත්‍ය ලෙසින්ම අනුකූල වූ අඩුම මිළ ගණන් ඉදිරිපත් කරනු ලැබූ ලංසුකරු වෙත ප්‍රදානය කරනු ලැබේ. තරඟකාරී ලංසු තැබීම ආරම්භ වන්නේ ඉල්ලුම සහ සැපයුම මගින් දක්වනු ලබන තරඟකාරී මිළ ගණන් ඉදිරිපත් කිරීමෙනි. එම අවස්ථාවේදීම මිළ ගණන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්වලදී ටෙන්ඩරය යටතේ සියලුම සැපයුම් සඳහා ප්‍රදානය කිරීමේ මිළ ස්ථාවරව පවතී. නියමයන්ට අනුව මිළ ගණන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්වලදී ප්‍රදානය කරන මාසය සහ නෞහාර බිල්පත් මාසය අතර ආගස් ගල්අඟුරු මිළ දර්ශකය (Argus Coal Price Index) මගින් විචලනය වන නිසා සැපයුම් මිළ සුනම්‍ය කරනු ලබයි. ඉහත කරුණු හැර, ටෙන්ඩර් පිරිවිතරවලට අනුව මිළ/තත්ත්ව අනුකූලතාව සහතික කිරීම පිණිස තත්ත්ව මිළ ගැලපීම හඳුන්වා දෙනු ලැබේ. එබැවින් ගල්අඟුරු මිළ සම්බන්ධයෙන් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමට තිබෙන අවදානම අඩුවන අනාවරණයක් වේ.

ii) ණය අවදානම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ එකම මිළදී ගන්නා වන්නේ ලං.වි.බ. මණ්ඩලය වන බැවින් එය ණය අවදානමට අනාවරණය වන්නේ නැත. කෙසේ වෙතත් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම වර්තමානයේ ණය අයකර ගැනීම සම්බන්ධ නෛතික කටයුතු සහ ව්‍යාපාර-ව්‍යාපාර කටික කරගැනීම සම්බන්ධයෙන් මුළුමනින්ම යොමුවී ඇත. ණය අයකර ගැනීමේ ප්‍රයත්නයන් අතර ප්‍රධාන වශයෙන් පහත සඳහන් ණය දැක්විය හැකි අතර එය මේ වනවිට දීර්ඝ නීතිමය කටයුත්තක්, බේරුම්කරණයක් සහ කටිකා කරගැනීමක් බවට පත්ව ඇත.

ලංකා නැව් සංස්ථාව
(CSC)රු. 539,192,079

ඉහත මුදල ඉන්දියාවේ ටෝරියන් අයන් ඇන්ඩ් සටිල් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත ගල්අඟුරු සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට හිගව පවතින අතර එකී සැපයුම සඳහා ලංකා නැව් සංස්ථාවට අනුව ඉහත සඳහන් මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ආරවුල විසඳීමේ කාර්යය භාණ්ඩාගාරය සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ලං.වි.බ. මණ්ඩලය සහ සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම යන ආයතනවලින් එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයින් 4 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විසින් හසුරුවන ලදි. කමිටුවේ වාර්තාව අමාත්‍ය මණ්ඩල ආර්ථික කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද අතර ඊට ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටිමු.

ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ්
(CSC)රු. 236,785,640

සත්‍ය වශයෙන්ම අනුකූල වූ අඩුව මිළ ගණන් ඉදිරිපත් කළ ලංසුකරු ලෙස ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් සමාගම වෙත පළමු ස්ථානීය ටෙන්ඩරය 2015-16 දී ප්‍රදානය කරනු ලැබීය. කෙසේ වෙතත්, තත්ත්ව ගැලපීමේ සූත්‍රය මෙහෙයවීමෙන් සහ ප්‍රසාද දීමනා ඉල්ලමින් ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනය විසින් ණයවර ලිපිය මත එහි දැක්වෙන මුදලට වඩා වැඩි මුදලක් ලබාගෙන ඇති බවට සොයාගනු ලැබීය. ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනය විසින් වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් multi-prong නඩුවක් ගොනුකර ඇත. මෙකී නඩු කටයුතුවලට පහත සඳහන් නඩු ඇතුළත් වේ.

i) වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත.

ii) මෙම කරුණ සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණයේ උපදෙස් මත සමාන්තර බේරුම්කරණ පටිපාටියක් පවතී.

අවදානම් කළමනාකරණය

iii) සමාගම වෙත එක්සත් ජනපද ඩොලර් 1,000,000 ක මුදලක් ගෙවන ලෙස නිකුත් කරන ලද අතුරු බේරුම්කරණ ප්‍රදානයට විරෙහිව ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනය විසින් ඇපෑලක් ගොනුකර ඇත.

iv) තවද, ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනය විසින් නිකුත් කරන ලද කාර්යසාධන ඇපකරය කැඳවන ලෙස සමාගම විසින් ඉල්ලුම් කර ඇත.

කෙසේ වෙතත්, ලිබර්ටි කොමොඩිටීස් ආයතනය විසින් සමාගමට විරෙහිව පිනීවා හි සිවිල් පටිපාටිකරයක් ගොනුකර ඇත. අපගේ නඩුවට පිනීවාහිදී පෙනී සිටීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිඥවරුන් අප විසින් නම් කරන ලදි. කෙසේ වෙතත් කාර්යසාධන ඇපකරය, ගල්අඟුරු සැපයීමේදී සිදුවන අඩුපාඩුකම් වෙනුවෙන් පමණක් සීමා වන නිසාත් ඇණවුම් කරන ලද ප්‍රමාණය නිසි පරිදි භාරදුන් බවත්, භාරගත් බවත් සමාගම විසින් ලිඛිතව තහවුරු කළ නිසාත් අපගේ අධිකරණය විසින් ලිබර්ටි කොමොඩිටීස් ආයතනයට පක්ෂව තීන්දුව ලබාදෙන ලදි.

කාර්යසාධන සමාලෝචනය

ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් මිලියන 2.25 ක් වන වාර්ෂික ගල්අඟුරු අවශ්‍යතාවය නොරොච්චොලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ප්‍රසම්පාදනය කොට ලං.වි.බ. මණ්ඩලයට සැපයීමය. ගල්අඟුරු මිළදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ සිට ටෙන්ඩර් කැඳවීම සහ නිම කිරීම, ප්‍රසම්පාදනය කිරීම සහ ලක්විජය ගල්අඟුරු බලාගාරයේ ජැටිය දක්වා ගල්අඟුරු ගෙනගොස් භාරදීම යන සියලුම ක්‍රියාකාරකම් වෙනුවෙන් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම වගකීමෙන් බැඳී සිටී. සෑම වසරකම සැප්තැම්බර් සිට ඊළඟ වසර් අප්‍රේල් මාසය දක්වා පුත්තලම වෙරළ නිරිතදිග මෝසම් සුළඟින් තදබල ලෙස බලපෑමට ලක්වන නිසා ඉහතින් සඳහන් කළ ගල්අඟුරු ප්‍රමාණය දින 210 ක් වැනි සීමිත කාලපරිච්ඡේදයක් තුළ සැපයිය යුතුය. එබැවින්, ගල්අඟුරු ගෙනගොස් භාරදීම මාස 5 ක කාලයක් අත්හිටුවන බවට අපේක්ෂා කෙරේ.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ මෙහෙවර වන්නේ ලක්විජය ගල්අඟුරු බලාගාරය මඟින් විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ඉහළ ප්‍රමිතියකින් යුත් ගල්අඟුරු නියම මිළට සැපයීම, ගල්අඟුරු දහනයේදී විමෝචනය වන ද්‍රව්‍ය කළමනාකරණය කිරීම, ඒවා පරිසර හිතකාමී නව්‍ය නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සහ එකී නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම, තාප බලශක්ති ප්‍රභවයක් ලෙස ගල්අඟුරු පෞද්ගලික අංශය සඳහා ප්‍රවර්ධනය කිරීම, කර්මාන්තකරුවන් වඩා ශක්තිමත් කිරීම සහ එමඟින් රටේ සංවර්ධනයට දායකවීම වේ.

ලංකා ගල්අඟුරු සමාගමේ 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. මෙම සියලුම නැව්බඩු තොග Term tender සහ spot tender යන දෙවැදෑරුම් ටෙන්ඩර් මඟින් සැපයීමට නියමිතය. Term tender මඟින් නැව්බඩු තොග 20 ක්ද ඉතිරිය spot tender මඟින්ද ආවරණය කරනු ඇත. එකී නැව්බඩු තොග 42 න් ලංකා ගල්අඟුරු සමාගම විසින් ආසන්න වශයෙන් මෙ.ටො. 1,100,000 වන පරිදි නැව්බඩු තොග 18 කින් 2020 - 2021 වර්තමාන කාලය සඳහා ලක්විජය ගල්අඟුරු බලාගාරය වෙත සපයා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම විසින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ග කළ හැකිය.

i) සැපයුම්කරුවන් ලියාදිංචි කිරීම, ටෙන්ඩර් ක්‍රියාවලිය සහ ප්‍රදානය කිරීම.

ii) ණයවර ලිපි විවෘත කිරීම, බැංකුකරුවන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම, බැංකු පහසුකම් විධිමත්, කිරීම භාණ්ඩාගාර ඇපකර සහ ලේඛන පවත්වා ගැනීම.

iii) ප්‍රසම්පාදනය, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව, ගල්අඟුරු පැටවූ ස්ථානයේ සිට ජැටිය දක්වා මාරු කිරීම සඳහා ගැල්කුලී සහ බත්තල් සේවා.

iv) ගැනුම්කරු (ලක්විජය ගල්අඟුරු බලාගාරය), සැපයුම්කරුවන්, පර්යන්ත මෙහෙයුම්කරුවන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ලංකා නැව් සංස්ථාව ආදිය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සහ පරදුදරන්නන් (stakeholders) අතර විවිධ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.

v) සපයන ලද ප්‍රමාණය සත්‍යායනය කිරීමෙන් පසුව සහ තත්ත්ව ගැලපීමේ සූත්‍රය අදාල කරගනිමින් ඉන්වොයිසියේ වටිනාකම්න් 80% ක් සහ 20% ක් නිදහස් කිරීම පිණිස භාරගැනීමේ සහ තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම.

ගල්අඟුරු ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය

ආරම්භක ගල්අඟුරු 2015.07.23 සහ 2015.10.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය පරිදි දීර්ඝකාලීන ටෙන්ඩර් (Term tenders) ඔස්සේ ප්‍රසම්පාදනය කරනු ලබන අතර ගල්අඟුරු ටෙන්ඩර ක්‍රම දෙකක් එනම් දීර්ඝකාලීන සහ කෙටිකාලීන (Spot) ටෙන්ඩර් යටතේ සිදුකිරීමට අනුමැතිය ලබාදෙන ලදි.

තෝරාගත් ගල්අඟුරු සැපයුම්කරුවන් විසින් ලබාදී ඇති ගැල්කුලී අනුපාත සංසන්දනය කිරීම පදනම් කරගෙන ගල්අඟුරු පටවනු ලබන වරායේ සිට ඒවා නිදහස් කිරීමට නැංගූරම් ලා සිටින වරාය දක්වා ප්‍රවාහනය කිරීම ලංකා නැව් සංස්ථාව විසින් මෙහෙයවනු ලබයි.

කාර්යසාධන සමාලෝචනය

ගල්අඟුරු බත්තල් මඟින් පුත්තලම නැංගූරම්පළේ සිට ලක්විජය බලාගාරයේ ජැටිය දක්වා ගල්අඟුරු ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව මඟින් සිදුකරනු ලබන අතර ඔවුන්ගේ බත්තල් සේවා සැපයුම්කරු විසින් මෙහෙයුම් කටයුතු සිදුකරනු ඇත.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ බලයලත් සාමාජිකයින්

ලක්විජය බලාගාරයේ ගල්අඟුරු අවශ්‍යතාවය පරිදි ගල්අඟුරු ටෙන්ඩර් සඳහා ටෙන්ඩර් කමිටුව පත්කරන ලෙස ලංකා ගල්අඟුරු සංස්ථාව අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටී. ඒ අනුව, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් අංශය විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව පත්කරනු ලබයි.

සියලුම ගල්අඟුරු නැව්බඩු තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශවලට අනුකූලව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත සපයා ඇත.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්

- තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති (සහකාර සාමාන්‍යාධිකාරී - උත්පාදන) ඇතුළුව ලංවිබ මණ්ඩලයෙන් නිලධාරීන් තිදෙනෙක්
- බලශක්ති අමාත්‍යාංශය නියෝජනය කරමින් එක් නිලධාරියෙකු
- මහජය බැංකුව නියෝජනය කරමින් එක් නිලධාරියෙකු
- ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව නියෝජනය කරමින් එක් නිලධාරියෙකු
- මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් එක් නිලධාරියෙකු
- ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම නියෝජනය කරමින් එක් නිලධාරියකු

වාණිජ අරමුණු ක්‍රියාවේ යෙදවීම

ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම සංස්ථාපනය කළ මුල් වර්ෂවලදී ගල්අඟුරු සැපයීමේදී මෙට්‍රික් ටොන් එකකට පාද අගය (base price) මත ලං.වි.බ. මණ්ඩලය විසින් බදු අයකරන ලදි. එබැවින් සමාග මේ කර්යසාධනය ප්‍රමාණවත් ය. 2017 වර්ෂයේ සිට ලං.වි.බ. මණ්ඩලය විසින් මිළ ව්‍යුහය වෙනස් කළ අතර සමාගමේ ශුද්ධ පොදුකාර්ය පිරිවැයට සමාග ගාස්තුවක් ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගට ප්‍රදානය කරන ලදි. ශුද්ධ පොදුකාර්ය පිරිවැය අර්ථ දක්වනු ලැබුවේ ලංකා ගල්අඟුරු සංස්ථාව විසින් උපයන ලද සැපයුම්කරුවන් ලියාදිංචි කිරීමේ ගාස්තු පොලී ආදි අනිකුත් අදායම්වල ශුද්ධ අගයේ දළ පොදුකාර්ය පිරිවැය වශයෙනි. ශුද්ධ පොදුකාර්ය පදනම් කරගත් ගාස්තුව ක්‍රියාත්මක කිරීමත් සමඟ වාණිජ යොමුව ක්‍රියාවේ යෙදවීම, අවම පිරිවැය වෙනුවට ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. එවක් පටන් මූලාශ්‍ර කිරීමේදී උපරිම පිරිවැයක් සහතික කිරීම පිණිස සමහර මිණුම් ලකුණු භාවිතා කර ඇත

2020-21 ගල්අඟුරු කාලය - ප්‍රසම්පාදන ප්‍රගතිය

නැව් වාර 42 ක් මඟින් මෙ.ටො. මි. 225+10% ක් සැපයීම 2022 - 21 කාලපරිච්ඡේදයේ අවශ්‍යතාවයයි. කාලපරිච්ඡේදයක් සඳහා මෙතෙක් ආනයනය කරන ලද ඉහළම ගල්අඟුරු ප්‍රමාණය මෙය විය. සෑම වර්ෂ 2 කට වරක් දීර්ඝකාලීන ගල්අඟුරු ටෙන්ඩර් (term tender) කැඳවනු ලබන අතර, කාලපරිච්ඡේද 2 ක් පුරා ඇස්තමේන්තුගත ගල්අඟුරු ප්‍රමාණය සැපයීමේ ටෙන්ඩරය තෝරාගත් සැපයුම්කරුට ප්‍රදානය කරනු ලැබේ. ලක්විජය බලාගාරයට අවශ්‍ය කරනු ලබන ඇස්තමේන්තුගත ප්‍රමාණය අනාගත ගල්අඟුරු කාලපරිච්ඡේදය සඳහා සැපයීමේ ඇණවුම ලංකා ගල්අඟුරු සමාගමට සෑම වසරකම ජූනි මාසය තුළ ලැබුණු පසුව ඉදිරියට යමින් පවතින ගල්අඟුරු කාලපරිච්ඡේදය සඳහා අවශ්‍ය කරනු ලබන ඉතිරි ප්‍රමාණය වෙනුවෙන් කෙටිකාලීන ටෙන්ඩර් (spot tende) කැඳවනු ලැබේ.

කාර්යසාධන සමාලෝචනය

සැපයුම්කරුවන් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අනුකූලනය කර ඇත. ඒ අනුව ඒ ඒ වර්ෂය ආරම්භයේදී ජාතික පුවත්පත්වල දැන්වීමක් පලකරනු ලබන අතර විදේශ කටයුතු අමාත්‍යාංශය හා ලංකා ගල්අඟුරු සමාගම් වෙබ්අඩවිය මගින් සියලු ශ්‍රී ලාංකේය විදේශ දූත මෙහෙවරයන්ට දැනුම් දෙනු ලැබේ.

ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත්‍ර සෑම සතියකම සඳුදා දින විවෘත කරනු ලබන අතර ඒවා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කරයි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරයි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැති ලැබීමෙන් පසුව ඇ.ඩො. 5,000 ක ලියාපදිංචි ගාස්තුවක් අයකර ගැනීමෙන් පසුව අදාල සැපයුම්කරු ලංකා ගල්අඟුරු සමාගමේ ලියාපදිංචි ගල්අඟුරු සැපයුම්කරුවෙකු ලෙසට ලියාපදිංචි කරනු ලැබේ.

2020-21 කාලපරිච්ඡේදය සඳහා ඉදිරිට යමින් පවතින ප්‍රසම්පාදන කාලසටහන

විස්තරය	ටෙන්ඩර් වර්ගය	නැව්බඩු තොග ගණන	ප්‍රමාණය මෙ.ටො.
2020-21 කාලපරිච්ඡේදය - ලක්විජය බලාගාරයට අවශ්‍ය කරනු ලබන ප්‍රමාණය		42	2,520,000
දීර්ඝකාලීන ටෙන්ඩර්වල (Term Tender) විස්තරය			
දීර්ඝකාලීන ටෙන්ඩරය - එල්සීසී419/ටිටී/2 (ප්‍රදානය කර ඇති දීර්ඝකාලීන ටෙන්ඩරය යටතේ අවශ්‍ය කරනු ලබන ඉතිරි ප්‍රමාණය)	දී.ටෙ.	20	1,200,000
කෙටිකාලීන ටෙන්ඩර්වල (Spot Tenders) විස්තරය			
කෙටිකාලීන 01 - එල්සීසී/20-21/එස්ටී/18/1 (මේ වනවිටත් ප්‍රදානය කර ඇත)	කෙ.ටෙ. - 1	5	300,000
කෙටිකාලීන 02 - එල්සීසී/20-21/එස්ටී/19/2 (අවලංගු කරන ලදි)	කෙ.ටෙ. - 2		
කෙටිකාලීන 03 - එල්සීසී/20-21/එස්ටී/20/3 (මේ වනවිටත් ප්‍රදානය කර ඇත)	කෙ.ටෙ. - 3	2	120,000
කෙටිකාලීන 04 - එල්සීසී /20-21/එස්ටී/21/4 (මේ වනවිටත් ප්‍රදානය කර ඇත)	කෙ.ටෙ. - 4	5	300,000
කෙටිකාලීන 05 - එල්සීසී /20-21/එස්ටී/22/5 (මෙම ටෙන්ඩරය)	කෙ.ටෙ. - 5	5	300,000
කෙටිකාලීන ටෙන්ඩර්වලින් සැපයිය යුතු ඉතිරි ප්‍රමාණය	කෙ.ටෙ. - 6	5	300,000

ඉල්ලුම් සංනෘප්තිය

පහත සඳහන් ප්‍රස්තාරික ඉදිරිපත් කිරීම මගින් පසුගිය වර්ෂ හතර තුළ ලක්විජය බලාගාරයේ ඉල්ලුම සම්බන්ධයෙන් ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම පූර්ණ ලෙස සෑහීමට පත්ව ඇති බවට සාක්ෂි දරයි.



CFT පදනම මත පළමු කෙටිකාලීන ටෙන්ඩරය (Spot Tender) කැඳවීම

නැව තෙක් නොමිළේ (FOB) සිට CFR වෙනස් කොට පළමු කෙටිකාලීන ටෙන්ඩර් (spot tender) පදනම මත කැඳවීම සහ ඒ අනුව CSC ගැල්කුලී අනුපාත සංසන්දනය කිරීමට අවස්ථාව ලබාදුන් නිසා ඒ.ඩො. 2.90 ක (12.95-10.05) මුදලක් ඵනම් ආසන්න වශයෙන් ඵකතුව ඇ.ඩො. 870,000 ක පමණ මුදලක් ලංකා ගල්අඟුරු සංස්ථාවට ඉතිරි කරගැනීමට හැකිවිය. මෙය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් සමඟ ගනු ලැබූ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

නැව තෙක් නොමිලේ (FOB) වෙනුවට 2020-21 කාලපරිඡේදය සඳහා CFR පදනම මත කෙටිකාලීන ටෙන්ඩර් (spot tenders) කැඳවීමෙන් ලංවිබ මණ්ඩලයට ලැබෙන ප්‍රතිලාභ.

2015-16 සිට 2019-20 කාලපරිඡේදය දක්වා කෙටිකාලීන ටෙන්ඩර්වලින් (term tenders) වැඩි ගණනක් නැව තෙක් නොමිළේ (FOB) පදනම මත කැඳවා ඇති අතර, දීර්ඝකාලීන ටෙන්ඩර් (term tenders) ගැල්කුලී අනුපාත කෙටිකාලීන ටෙන්ඩර් (spot tenders) සඳහාද සැලකිල්ලට ගෙන ඇත. මෙම ක්‍රමය 2020-21 කාලපරිඡේදයේදී CFT ට පමණක් වෙනස් කර ඇත. ඒ අනුව, කෙටිකාලීන (spot) 3 සහ 4 මගින් පහත සඳහන් ප්‍රතිලාභ ලබාගෙන ඇත.


කාර්යසාධන සමාලෝචනය

Comparison of Freight Charges if Spot Tender Called on FOB Baisis instead of CFR

Shipment No.	Supplier	Supplied Qauntity MT	If Spot Called on FOB Basis in US $		Actual Freight rate of Spot shipments in US $		Loss Due to if Spot Called on FOB	Total Savings from CFR - Rs.
			Per/MT	Cost if Term Rate apply to Spot	Per/MT	Total US $		
Spot 1								
	SSOE	58,868	$ 13.04	767,638.72	10.05	591,623.40	176,015.32	32,853,259.48
		64,514	$ 13.04	841,262.56	10.05	648,365.70	192,896.86	36,004,198.92
		61,641	$ 13.04	803,798.64	10.05	619,492.05	184,306.59	34,400,825.02
		58,570	$ 12.91	756,138.70	10.05	588,628.50	167,510.20	31,265,778.83
		60,958	$ 12.91	786,967.78	10.05	612,627.90	174,339.88	32,540,538.60
Spot 3								
274-13	SSOE	54,714.00	$ 12.85	703,074.90	9.99	546,592.86	156,482.04	29,207,372.77
276-15		54,714.00	$ 12.85	785,507.65	9.99	610,678.71	174,828.94	32,825,881.77
Spot 4								
278-17	ADANI	54,011.00	$ 12.85	694,041.35	8.99	485,558.89	208,482.46	39,036,255.81
280-19		54,000.00	$ 13.00	702,000.00	8.99	485,460.00	216,540.00	40,544,949.60
282-21		60,000.00	$ 13.00	780,000.00	8.99	539,400.00	240,600.00	45,049,944.00
284-23		60,000.00	$ 13.00	780,000.00	8.99	539,400.00	240,600.00	45,049,944.00
285-24		60,000.00	$ 13.00	780,000.00	8.99	539,400.00	240,600.00	45,049,944.00
				5,224,623.90		3,746,490.46	2,373,202.29	443,828,892.80

ප්‍රමාද ගාස්තු


ප්‍රමාද ගාස්තු පිරිවැය - පිරිවැය අකාර්යක්ෂමතාවට චිකතු කිරීමේදී මුල් වර්ෂ තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සැලකිය යුතු බරක් විය. කෙසේ වෙතත්, සැපයුම් දාමයේදී සම්බන්ධ වූ කරුණු අතරතුර මෙයෙහුම් උපායමාර්ගිකව කළමනාකරණය සහ සම්බන්ධීකරණය කිරීම මගින් පිරිවැය ක්‍රමක්‍රමයෙන් අන්තර්ගත කිරීමට ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමට හැකි විය. ප්‍රතිඵල පහත දැක්වෙන රේඛා රූපසටහ මගින් ප්‍රමාණවත්ව පෙන්වා ඇත.



නැව්බඩු තොග හැසිරවීමේ ගාස්තු අඩු කිරීම

2010-11 සිට 2016-17 දක්වා කාලපරිච්ඡේදය සඳහා නැව්බඩු තොග හැසිරවීමේ ගාස්තුව එක් නැව්බඩු තොගයක් සඳහා රු. මිලියන 1.16 ක් විය. 2018/2019 කාලපරිච්ඡේදයේදී නැව්බඩු තොග හැසිරවීමේ ගාස්තු අඩුවීම එක් නැව්බඩු තොගයකට රු. මිලියක 0.585 ක් විය. නැව්බඩු තොග රේගු නිෂ්කාශන කොටස සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් සිදුකරන ලදි.


2019/2020 කාලපරිච්ඡේදයේදී නැව්බඩු තොග රේගු නිෂ්කාශන කාර්යය ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම විසින් සිදුකරන ලදි. 2019/2020 කාලපරිච්ඡේදය සඳහා නැව්බඩු තොග හැසිරවීරම් ගාස්තු අඩුවීම එක් නැව්බඩු තොගයකට රු. 85,000/- ක් විය.



කාර්යසාධන සමාලෝචනය

රක්ෂණ අනුපාත අඩු කිරීම

2016 - 2017 කාලපරිච්ඡේදය සඳහා මෙ.ටො. 1 කට ඩ.ඩො. 0.05 ක් වූ අතර, 2017/2017 කාලපරිච්ඡේදයේදී මෙ.ටො. 1 කට ඩ.ඩො. 0.048 ක් දක්වාද, 2018/2019 කාලපරිච්ඡේදයේදී මෙ.ටො. 1 කට ඩ.ඩො. 0.025 ක් දක්වාද, 2019/2020 කාලපරිච්ඡේදයේදී මෙ.ටො. 1 කට ඩ.ඩො. 0.0125 ක් දක්වාද පහළට ගෙන එන ලදි. මෙයද ගල්අඟුරු සඳහා දැරිය යුතු පිරිවැයේ සැලකිය යුතු අඩුවීමකි.



ගැල්කුලී ගැලපීමේ ගාස්තු ඉවත් කිරීම

ගැල්කුලී ගැලපීමේ ගාස්තු ඊළඟ කාලපරිච්ඡේදවල (2020/2021) සිට ඉවත් කරනු ලැබේ. පසුගිය කාලපරිච්ඡේද (2018/2019) සඳහා අප විසින් මෙම ගාස්තුව ලෙස රු. මිලියන 87 ක මුදලක් ගෙවා ඇත.


SLPA ගාස්තු අඩු කිරීම සහ රෙගු ගාස්තු ඒකාබද්ධ කිරීම

SLPA සහ ඒකාබද්ධ රේගු ගාස්තු, මුවී ගැල්කුලී ගාස්තුවලට ඇතුළත් වන අතර ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම එක් නැව්බඩු තොගයකදී රු. මිලියන 1 ක මුදලක් ඉතිරි කර ගනී.

2021-2022 කාලපරිච්ඡේදය සඳහා ගල්අඟුරු සැපයීම

2021-2011 සිට 2022-2023 දක්වා වන කාලපරිච්ඡේද දෙක සඳහා නව දීර්ඝකාලීන ටෙන්ඩර් (Term Tender) කාලසටහන්ගත කිරීමේ අවශ්‍යතාවය ඇත. සාමාන්‍ය කාලසටහනට අනුව 2021-2022 දක්වා කාලය සඳහා අවශ්‍ය කරනු ලබ මුළු ප්‍රමාණයෙන් 50% ක් දීර්ඝකාලීන ටෙන්ඩර්වලින් සපයනු ලැබේ. සැපයුම් කාලසටහන AP14 දර්ශක විශ්ලේෂණය පදනම් කරගෙන සකස් කරනු ඇත. පසුගිය කාලපරිච්ඡේද හතරෙහි AP14 දර්ශකය පහත පරිදි වගුගත කර ඇත.

වගු අංක : 3 - පසුගිය කාලපරිච්ඡේද හතරෙහි AP14 ගල්අඟුරු දර්ශකයේ හැසිරීම



අනාගත උපායමාර්ගික සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ පුනර්ජීවන බලශක්ති අමාත්‍යාංශයේ මඟපෙන්වීම ඇතිව සමාගම පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

- SORP **පිළියෙල කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි අත්පොත සහ ලංකා ගල්අඟුරු සමාගම අනුකූලනය කිරීම සඳහා අනිකුත් ක්‍රියාපටිපාටීන්**

ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ආරම්භයේ සිට මනාව පිළියෙල කරන ලද SORP එකක් නොතිබුණු නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සමාගම සඳහා SORP එකක් පිළියෙල කරමින් පවතින අතර එකී SORP එකේ කෙටුම්පත සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලං.වි.බ. මණ්ඩලයෙන් සමාජිකයින් දෙදෙනෙක්, CSC ආයතනයෙන් එක් සාමාජිකයෙකු, අමාත්‍යාංශයෙන් එක් සාමාජිකයෙකු සහ ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමෙන් එක් සාමාජිකයෙකු වශයෙන් සාමාජිකයින් පස්දෙනෙකුගෙන් සමන්විත පත්කිරීමට තීරණය කරන ලදි.

- **ගල්අඟුරු පුද්ගලික අංශය වෙත සැපයීම**

සිය උදුන්/බොයිලේරුවලට තාප ගල්අඟුරු භාවිතා කරන කර්මාන්තකරුවන් කිහිපදෙනෙකු ශ්‍රී ලංකාවේ සිටිති. ඔවුන්ට ගල්අඟුරු අවශ්‍ය වන්නේ ඉතා කුඩා ප්‍රමාණවලින් වන අතර ඔවුන්ගේ පිරිවිතර එකිනෙකට වෙනස්ය. එබැවින් සියලුම කර්මාන්තකරුවන් සෑහීමට පත්වන අයුරින් එක් ගල්අඟුරු නැව්බඩු තොගයක් ගෙනවීම දුෂ්කරය. කෙසේ වෙතත් ආරම්භයේදී කුඩා ගල්අඟුරු නැව්බඩු තොගයක් ගෙනවීම පිණිස ලංකා ගල්අඟුරු පුද්ගලික සමාගම ඔවුන් සමග සාකච්ඡා කරමින් සිටී.

- **තරඟකාරිතවය වැඩිකිරීම පිණිස ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සමන්විය පුළුල් පදනම.**

මේ සම්බන්ධ කටයුතු ආරම්භ කර ඇත. මේ වනවිට සැපයුම්කරුවන් 26 දෙනෙකු ලියාපදිංචි කර ඇති අතර ඔවුන්ගෙන් 17 දෙනෙකු මෙහෙයුම් කටයුතුවල නිරතව සිටිති. 2020 වර්ෂයේ අවසානයේ සිට සෑම වසරකම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය කිරීමට සහ වසර තුනකට පසුව ඔවුන් යෝග්‍යතා පරීක්ෂණයකින් නැවත ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ජාත්‍යන්තර ක්‍රියාපටිපාටීන්ට අනුකූලව අදාල තානාපති කාර්යාල හරහා පුළුල් ප්‍රසිද්ධියක් ලබාදෙමින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව සම්පාදනය කරනු ඇත.

- **ගැනුම් මිළෙහි අන්තර්මාධ්‍ය පිරිවැය වළක්වමින් මිළ ගණන් ඉදිරිපත් කිරීමට පතල් හිමියන්ට ආරාධනා කිරීම.**

අපගේ ටෙන්ඩර් කැඳවීම්වලදී ඒ සඳහා සෘජුවම මිළ ගණන් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ගල්අඟුරු පතල් හිමියන්ටද සලසා දෙමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් සිටිමු. ප්‍රධාන පතල්හිමියෙකු වන ග්ලෙන් කෝර් (Glen Core) මහතාද මේ වනවිට සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි කර ඇත. දේශයේ යහපත උදෙසා රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා භාවිතා කරමින් ගල්අඟුරු රටවල් දෙකක් අතර (G to G) මිළට ගැනීමට අවශ්‍ය අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය විසින් ගනිමින් සිටී.

- අඟුරු දහනයේදී විමෝචනය වන ද්‍රව්‍යවලට එරෙහිව කටයුතු කිරීම සඳහා 'හරිත ආර්ථිකය' නමැති පිය සටහන ප්‍රවර්ධනය කිරීම.
- ගල් අඟුරු දහනයේදී නිපදවෙන කාබන් ඩයොක්සයිඩ්, ඔක්සිජන් වැනි නව අතුරු නිෂ්පාදන වෙන් කර ගැනීම.
- යථාර්ථයක් ලෙස දැනට පවතින මාස හයේ මෝසම් වැසි සැපයුම් කාලය (six month monsoon delivery window) 'දින 365 පුරා සැපයීමට' හැකි පරිදි කටයුතු කිරීම.

මේ සඳහා විකල්ප යෝජනා කිහිපයක් තිබෙන අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ හා විදුලිබල මණ්ඩලයේ මඟපෙන්වීම ඇතිව එක්ව කටයුතු කරමින් සිටිමු.

- දැනට පවතින ජැටිය පුත්තලම නැංගූරම්පොළ දක්වා පුළුල් කිරීම (කි.මී. 4)

අනාගත උපායමාර්ගික සැලැස්ම

- ලංකා ගල්අඟුරු සංස්ථාව නැව් ප්‍රමාණය 60,000 ±10% මෙ.ටො. සිට 65,000 ±10% මෙ.ටො. දක්වා වැඩි කිරීමට සැලසුම් කරමින් සිටි.
- ජැටියේ දෙපැත්තම ගල් අඟුරු බෑමේ පහසුකම
- ගියර රහිත වඩාත් විශාල නැව් භාවිතා කිරීම සහ නැවෙන් නැවට මාරු කිරීම භාවිතා කරමින් බඩු බෑම
- නැංගූරම්පොළ දක්වා ජැටිය පුළුල් කිරීම
- දුම්රිය මාර්ගයේ ත්‍රිකුණාමලය දිගුවේ සිට ත්‍රිකුණාමලය - මහව - ලක්විජය බලාගාරය දක්වා ගල්අඟුරු ප්‍රවාහනය කිරීම

- **ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම**

ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ආරම්භ කළ දින සිට ඉහත සඳහන් කළ සැලසුම් 2 විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. මෙම සැලසුම් දෙකම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසුව අනුකූලනය කර ඇති අතර එකී සැලසුම් දෙක සඳහා විධිමත් අනුමැතිය ලබාගැනීම පිණිස අමාත්‍යාංශය යවා ඇත.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.



සභාපති
සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

සීමාසහිත ලංකා ගල්අඟු (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වෙනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ආදායම් බදු සම්බන්ධ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්හි 88 ඡේදය ප්‍රකාරව (LKAS 12) 2017/2018 තක්සේරු වර්ෂය සඳහා වූ ආර්ථික සේවා ගාස්තුවලට (ESC) අදාළව රු. 159,549,619 ක්වූ තත්සේරු කිරීම සහ ඒ පිළිබඳව පනවා තිබූ රු. 75,461,644 ක්වූ දඩ මුදල සම්බන්ධයෙන් අනාවරණය කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ රු. 2,559,819 ක හර ශේෂයක් දරමින් ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු රු. 12,073,788 ක මුදලක් විලම්බිත ගිණුමේ අන්තර්ගතව තිබූ අතර 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු. 4,674,041 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ කිසිඳු හේතු දැක්වීමක් නොමැතිව සමාගම විසින් ඉහත සඳහන් කළ මුදල විලම්බිත ගිණුමට රු. 1,594,325 ක මුදලක් හර කර තිබූ අතර රු. 3,708,547 ක මුදලක් බැර කර තිබුණි.

(ඇ) ගල්අඟුරු ආනයනය කිරීමේදී තථ්‍ය ලෙස නොදරනු ලබන, රේගු කාර්යය පිණිස වටිනාකම නිශ්චය කිරීමේදී කල්පිත ගැලපීමක් ලෙස රේගුවේදී වටිනාකමට 10% ක දළ ලාභයක් එකතු කරනු ලබයි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. 3,653,155,934 ක එවැනි 10% දළ ලාභයක් ආදායමට එකතු කර තිබූ අතර පසුව සමාගම එවැනි මුදලක් ණයගැතියා වෙත වට්ටමක් ලබාදී එය විකුණුම් පිරිවැයට අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පිරිවැය සහ ආදායම සමාන අගයකින් වැඩි කර දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු අවසන් වැට් බදු සහ අනිකුත් අයවිය යුතු සහ අයවිය යුතු වෙළඳ ණයගැතියෝ පිළිවෙලින් රු. 197,452,711 ක් සහ රු. 12,073,788 ක් විය. කෙසේ වෙතත් එය ලං.වි.බ. මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. එබැවින්, විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොතිබූ නිසා වෙළඳ ණයගැති ශේෂය නිශ්චය කිරීමට විගණනයට නොහැකි විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අයවිය යුතුව තිබූ වසර 3 කටත් වැඩි කාලයක සිට හිඟව පවතින අයවිය යුතු රු. 10,624,394 ක්වූ කළමනාකරණ ගාස්තු අපහායනය කිරීමට සමාගම විසින් කිසිඳු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

(ඊ) ලේඛනවලට අනුව 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලපරිච්ඡේදය තුළ ආනයනය කරන ලද ගල්අඟුරුවල නිවැරදි ගනුදෙනු අගය ප්‍රකාශ නොකිරීම මත සමාගම විසින් ශ්‍රී ලංකා රේගුව වෙත රු. 205,000,000 ක දඩ මුදලක් ගෙවා තිබුණි. 2019 වර්ෂයේදී ගෙවන ලද දඩ මුදල අනුපිළිවෙල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට එය ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සීමාසහිත ලංකා නැව් සංස්ථා (CSCL) ණය ගිණුමට හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ රඳවාගත් ඉපැයුම් රු. 205,000,000 ක් වැඩි කර දක්වා තිබූ අතර, ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සීමාසහිත ලංකා නැව් සංස්ථා (CSCL) ණය ගිණුම පිළිවෙලින් රු. 158,186,165 කින්, රු. 39,970,418 කින් සහ රු. 6,843,417 කින් අඩු කර දක්වා තිබුණි.

(උ) ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැණි ලිමිටඩ් (TISCL) සමාගමෙන් සීමාසහිත ලංකා නැව් සංස්ථාවට (CSCL) අයකරගත යුතුව තිබූ රු. 539,192,079 ක හිඟ ණය මුදල අයකර ගැනීමට ක්‍රියා කිරීමට සමාගම අපොහොසත්වී ඇති අතර එය අපහායනය කිරීමට ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද, ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පැණි ලිමිටඩ් (TISCL) සමාගම හෝ සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) යන ආයතන දෙකින් එකක්වත් මෙම ශේෂය තහවුරු කර නොතිබුණි. එබැවින් ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ අස්ථිත්වය නිශ්චය කර ගැනීමට නොහැකි වුණි.

(උ) ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු රු. 578,678,686 ක්වූ ආර්ථික සේවා ගාස්තු (ESC), රු. 18,075,801 ක්වූ විවිධ ණයගැතියන්, නොබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙන් අයවිය යුතු රු. 1,115,987 ක මුදල, නොබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට ගෙවිය යුතු රු. 85,887,776 ක මුදල සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් ආයතනයෙන් අයවිය යුතු රු. 8,048,531 ක එස්පීඑස් (SGS) ගාස්තුවල ශේෂ තහවුරු කිරීම් සහ ඒවා සත්‍යායනය කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(එ) ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ලං.වි.බ. මණ්ඩලය විසින් ගැල්කුලී සහ වැට් ගාස්තු සඳහා වෙන් වෙන්ව ගෙවන ලද රු. 285,375,105 ක මුදල අනාවරණය කිරීමකින් තොරව "තාප ජනක ගල්අඟුරු නැව්බඩු තොග සඳහා වෙළඳ ණයගැති" ගිණුමෙන් අඩුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස තාප ජනක ගල්අඟුරු නැව්බඩු තොග සඳහා වෙළඳ ණයගැති ශේෂයන් සහ ලං.වි.බ. මණ්ඩලයෙන් ලැබුණු අත්තිකාරම් මුදල රු. 285,375,105 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) මූල්‍ය ප්‍රකාශනවලට බැඳීමක් නොමැතිව සමාගම, සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) ලවා සිංගප්පූරු සමාගමට රු. 4,000,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම මෙම මුදල සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ (CSCL) ගෙවිය යුතු ශේෂයෙන් වැරිදි ලෙස අඩුකර තිබුණි. එසේ හෙයින් බැරකම් ඊට සමාන අගයකින් අඩු කර දක්වා තිබුණි.

(ඔ) නැව්බඩු තොග අංක 123 වෙනුවෙන් සමාගම විසින් රු. 136,236,370 ක මුදලක් රේගු වැට් බදු ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත් Cusdec ට අනුව තථ්‍ය වැට් මුදල රු. 106,969,404 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස වැට් බදු සඳහා සමාගමට රු. 29,266,965 ක මුදලක් වැඩිපුර දැරීමට සිදුවී ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් තොරතුරු ලබාගත හැකි විටෙකදී ඒවා කියවීම සහ එසේ කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්. වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයෙක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විගණනය කළ යුතුය. මාගේ නිගමනයන් පදනම් වන්නේ මාගේ විගණන වාර්තාවේ දින දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) (අ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර විගනණය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වෙනි වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අ) (සසස) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පූර්වගාමී වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය අනුව පාලක සමාගමේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

රෙගුලාසි / නියෝගවලට යොමුව	විස්තරය
(අ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	
(i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	(i) කළමානාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියක් (SORP) සමාගම සතුව නොතිබුණි.
	(ii) චක්‍රලේඛයට පටහැනිව සමාගම විසින් 2017 වර්ෂයේ සිට ආපදා ණය ගෙවීමේ යෝජනාක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි.
	(iii) සමාගම විසින් අනුමැතියකින් තොරව පාවිච්චි නොකරන ලද අසනීප නිවාඩු වෙනුවෙන් රු. 1,418,274 ක මුදලක් ප්‍රතිපාදන වශයෙන් වෙන්කර තිබුණි.
(ii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,795,212 ක මුදලක් කාර්යමණ්ඩල ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.
(ආ) විධිමත්ව සංශෝධනය කරන ලද 2016 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ 6 වෙනි ඡේදය	ඊවිස්සී (ESC) බැරකම් අදාල මාසයේ කාර්තුව අවසන්වී එළඹෙන මාසයේ විසි වෙනි දින හෝ එදිනට පෙර ගෙවිය යුතු ය. කෙසේ වෙතත්, ගෙවිය යුතුව තිබූ මුළු ඊවිස්සී (ESC) මුදල වන රු. 579,179,232 ක මුදල මෙම වාර්තාවේ දින වනවිටත් සමාගම විසින් ගෙවා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.5 අනිකුත් කරුණු

(අ) සමාගමේ සේවකයෙකු විසින් 2018 වර්ෂයේදී ගෙවීම් වවුචර්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී රු. 590,193 ක මුදලක් වංචා කර තිබුණි. කෙසේ වෙතත් සමාගම විසින් එකී සේවකයාට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් මෙම වාර්තාවේ දින වනවිටත් ගෙන නොතිබුණි.

(ආ) සාමාන්‍යාධිකාරි තනතුර පුරප්පාඩුව තිබී ඒ සඳහා වැඩ බැලීමේ පත්වීමක් 2017 ඔක්තෝම්බර් 01 වෙනි දින සිදුකර තිබුණි. කෙසේ වෙතත් එම පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2021 ජූලි 31 දින වනවිටත් ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ඔබේ අංකය : පීඕඊ/ඩී/එල්සිසී/එෆ්විස්/2020/14
2021 අගෝස්තු 18

නියෝජ්‍ය විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය වෙත,

අවධානයට : පී.ඒ.විස්. ආරච්චි
විගණන අධිකාරී (වැඩ බලන)

මහත්මයාණෙනි,

සීමාසහිත ලංකා ගල්අඟුරු සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ අනිකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වෙනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු

උක්ත කරුණ සම්බන්ධයෙන් 2021.08.17 දිනැති විගණකාධිපති වාර්තාවට පිළිතුරු මෙහිලා ඉදිරිපත් කරමි.

1.2 මතය සඳහා පදනම

1.2 (අ) සඳහා පිළිතුර

ESC පියවීම සඳහා කාල දිගුවක් ඉල්ලමින් ලිපියක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට යවන ලද අතර, ESC පියවීම සම්බන්ධයෙන් ලං.වි.බ. මණ්ඩලය සමඟ සමාදාන ගිවිසුමකට එළඹෙන තෙක් මේ සම්බන්ධයෙන් සමාගමට විරුද්ධව යම් මුදල් අයකර ගැනීමේ ක්‍රියාවක් හෝ බදු පැනවීමක් සිදුකිරීමෙන් වළකින ලෙස ඉල්ලමින්ද ලිපියක් යවන ලදි. ESC පියවීම පිණිස මුදල් නිදහස් කරන ලෙස ඉල්ලමින් සිහිකැඳවීමේ ලිපියක් යැවීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය ලදි. ඊට අමතරව, ආදායමේ අන්තර්ගතය වන 10% ක් වන කල්පිත අන්තය (Notional Margin) ඉවත් කරමින් ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් ලංකා ගල්අඟුරු සංස්ථාව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කරන ලදි. ඔබගේ දැනගැනීම පිණිස එම ලිපිය මෙයට අමුණා ඇත.

1.2 (ආ) සඳහා පිළිතුර

අංක සීඊබී/සීඅයිඒ/විස්ඒ-33/2019-85 දරණ අභ්‍යන්තර විගණන වාර්තාව පදනම් කරගෙන අංක 11422 කේ -154 දරණ නැවිබඩු ගිණුමට රු. 3,708,547.05 ක මුදලක් බැර කරන ලදි. එකී විගණන වාර්තාවේ පිළිතුරට අනුව, අප විසින් එම බර සටහන සිදුකර ඇත්තේ ගෙවීම් වවුචර් අංක පීවිපිබී0050-2016 යටතේ 2016 වර්ෂයේ සිදුවී ඇති ගිණුම්කරන දෝෂයක් නිවැරදි කිරීමට ය.

අංක 11422කේ 154 දරණ නැවිබඩු ගිණුමට රු. 1,594,325.32 ක මුදලක් හරකිරීමට මෙය නොගෙවන ලද බත්තල් ගාස්තු වැට් බදු වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට නිකුත් කරන ලද 2020.07.17 දිනැති රු. 15,870,104.32 ක්වූ බැර සටහනේ ඉතිරි මුදල වේ. 2016 වර්ෂයේදී ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු මුදලට එරෙහිව ලංකා ගල්අඟුරු සංස්ථාව විසින් මේ වනවිටත් රු. 14,275,779 ක මුදලක් හිලව් කර ඇත.

1.2(ඇ) සඳහා පිළිතුර

ලං.වි.බ. මණ්ඩලය වෙත වැට් බදු ඉන්වොයිසි කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සඳහා රේගු අන්ත (Customs Margin) එකතු කරන ලෙස දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව (IRD) විසින් නියෝගයක් ලබාදී ඇත. මෙම මිළ යාන්ත්‍රණය උපයෝගී කරගනු ලැබුවේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ (IRD) නියෝජිතයෙකුද සහභාගිවූ 2018 ජූනි මස 28 වෙනි දින අමාත්‍යාංශයේදී පවත්වන ලද රැස්වීමෙන් පසුව ය. ලං.වි.බ. මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන ඉන්වොයිසි මත වූ වැට් බදු සඳහා පදනම් අගය රේගු කාර්යය සඳහා වන අගයට වඩා අඩුවිය නොහැකි බවට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරියා විසින් පවසා ඇති අතර ඒ බැව් වාර්තා කොට සටහන් කර ඇත. එසේ හෙයින් 10% ක ප්‍රමාණයක් තනිකරම දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙ නියෝගය වත එකතු කරන ලදි. එවක් පටන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නියෝග

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

යට ලං.වි.බ. මණ්ඩලය අභියෝග කරමින් ඔවුන් විසින් 2018.09.07 දිනැති ලිපිය යවා ඇති අතර ඒ සඳහා ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නැත. එතෙක් ඉන්වොසි සඳහා 10% ක රේගු අන්ත (Customs Margin) අප විසින් එකතු කළ අතර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන අතුරු අතිරික්ත නිකුතුවක් තුළ එම දෙපාර්තමේන්තුව වෙත කිසිඳු අතිරේක නිමැවුම් වැට් බදු (Output VAT) අප විසින් ප්‍රේෂණය කරන්නේ නැත. ආදායමේ අන්තර්ගත 10% ක කල්පිත අන්තය (Notional Margin) ඉවත් කොට නිමැවුම් වැට් බදු (Output VAT) ගණනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් ලංකා ගල්අඟුරු සමාගම දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. ඔබගේ දැනගැනීම පිණිස එම ලිපිය මෙයට අමුණා ඇත.

1.2(ඈ) සඳහා පිළිතුර

අවසන් වැට් බදු සහ ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු අනිකුත් මුදල් - රු. 197,452,711 :

ශ්‍රී ලංකා රේගුව විසින් සිදුකරන ලද විමර්ශනයට අනුව, 2016.09.19 සිට 2018.04.09 දක්වා කාලය තුළ ලංකා ගල්අඟුරු සංස්ථාව විසින් ආනයනය කරන ලද ගල්අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශයට පත්කළේ නැත. රේගු නිලධාරීන්ගේ උපදෙස් පරිදි ගෙවිය යුතු වැට් බදු කොපමණද යන්න ලංකා ගල්අඟුරු සංස්ථාවේ සහ ලං.වි.බ. මණ්ඩලයේ නිලධාරීන් විසින් ගණනය කර ඇති අතර අංක 123 සිට 154 දක්වා නැව්බඩු තොග සඳහා ගෙවිය යුතු වැට් බද්ද රු. 195,780,909 ක් බවට සොයාගෙන ඇත. ඊට අමතරව, එකී නැව්බඩු තොගවලට අදාල විනිමය පාඩු සඳහා රු. 1,671,802 ක මුදලක් ගෙවන ලෙසට ලංකා ගල්අඟුරු සංස්ථාව ලං.වි.බ. මණ්ඩලයෙන් ඉල්ලා ඇත. 2020 වර්ෂාවසාන විගණන කාර්යය පිණිස ඉහත ශේෂය තහවුරු කරන ලෙසට ලංකා ගල්අඟුරු සංස්ථාව විසින් ලං.වි.බ. මණ්ඩලයෙන් ඉල්ලා ඇති අතර මූල්‍ය ප්‍රකාශන අවසන් කරනු ලැබූ දිනට පවා ඔවුන් විසින් එකී තහවුරුව ලබාදී නොමැත. ගෙවිය යුතු වැට් බදු සම්බන්ධයෙන් ලං.වි.බ. මණ්ඩලය මේ වනවිට කටයුතු කරමින් සිටින අතර නුදුරු අනාගතයේදී එය පියවනු ඇත.

වෙළඳ ණයගැතියන් අන්තර්ගතවීම (ලං.වි.බ.ම.) - ස්ටීම් කෝල් රු. 12,073,88 පහත දක්වා ඇත.

- ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු රු. 2,563,287 : 2017 වර්ෂයේදී ලං.වි.බ. මණ්ඩලය සමඟ ගිණුම් පියවීමෙන් පසුව ඉතිරි වූ මුදල. මූලාශ්‍රය / මූලාරම්භය සොයා දැනගැනීම පිණිස තවදුරටත් විමර්ශනය කරමින් පවතී.
- වෙළඳ ණයගැතියන් (ලං.වි.බ.ම.) - ස්ටීම් කෝල් රු. 7,750,000 : ලං.වි.බ. මණ්ඩලය වෙනුවෙන් මාකේටර් (M/s Marcator) ආයතනයට ගෙවන ලද මුදල. මූලාශ්‍රය / මූලාරම්භය සොයා දැනගැනීම පිණිස සලකා බලමින් සිටී.
- ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු අනිකුත් මුදල් රු. 1,760,500 : 2017 වර්ෂයේ ගිණුම් පියවීමෙන් පසුව ඉතිරී වූ මුදල. මූලාශ්‍රය / මූලාරම්භය සොයා දැනගැනීම පිණිස තවදුරටත් විමර්ශනය කරමින් පවතී.

1.2(ඉ) සඳහා පිළිතුර

එල්වීවීපී හි යන්ත්‍රාගාර කළමනාකරුගේ කාර්යාලයේදී 2020 ජූනි මස 17 වෙනි දින පවත්වන ලද රැස්වීම පරිදි සියලුම වියදම් ලං.වි.බ. මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගනුදෙනුවලට සිදුකරන ලද බව සඳහන් කරමින් කළමනාකරන ගාස්තු ඉන්වොයිසිය සමඟ යුක්තිසාධන ලිපියක් එවන ලෙසට සහකාර සාමාන්‍යාධිකාරී (සාමාන්‍ය) විසින් ඉල්ලා සිටින ලදි.ඉදිරියට එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී මේ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නියමිත අතර ඉහත කී ලිපිය යැවීමෙන් පසුව අදාළ කළමණාකරණ ගාස්තු හිඟ මුදල පියවීමට ලංකා විදුලි බල මණ්ඩලය කටයුතු කරනු ඇත.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

1.2(ඊ) සඳහා පිළිතුර

ශ්‍රී ලංකා රේගුව විසින් සිදුකරන ලද විමර්ශනය පරිදි 2016.09.19 සිට 2018.04.09 දක්වා කාලසීමාව තුළ ආනයනය කරන ලද ගල්අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ලංකා ගල්අඟුරු සමාගම විසින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. එම කාලය තුළ රේගු ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හසුරුවනු ලබුවේ එක් නැව්බඩු තොගයකට රු. 1,000,000/- ක ගාස්තුවක් වන පරිදි ලංකා නාවික සංස්ථාව (සීවිස්සී) විසින් වන අතර ඉහත සාවද්‍ය ප්‍රකාශයට පත්කිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් ලංකා ගල්අඟුරු සංස්ථාව වෙත රු. 205,000,000/- ක අහිමිකිරීමක් පනවා ඇත. තවද මෙම ගෙවීමෙන් පසුව වෙනත් කිසිඳු අවසන් වැට් බදු ගෙවීමක් සිදුකිරීමට අවශ්‍ය නොවන බවට ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් විසින් ලංකා ගල්අඟුරු සංස්ථාවේ නිලධාරීන් වෙත දන්වා ඇත.

එම අවස්ථාවේදී ඉහත කී අදාල නැව්බඩු තොග සඳහා අවසන් වැට් බදු වශයෙන් ලංකා ගල්අඟුරු සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත රු. 37,594,744 ක මුදලක් ගෙවා ඇති අතර ගල්අඟුරු නැව්බඩු තොග නිෂ්කාශනය කිරීම ශ්‍රී ලංකා රේගුව විසින් නවත්වනු ලැබූ නිසා ලං.වි.බ. මණ්ඩලය විසින් සීමා සහිත ලංකා නැව් සංස්ථාවෙහි හිඟ මුදල් පියවීම සඳහා ලබාදෙන ලද මුදල් භාවිතා කරමින් රු.මි. 205 ක්වූ දඩ මුදල ගෙවීමට ලංකා ගල්අඟුරු සංස්ථාවට සිදුවිය.

1.2(උ) සඳහා පිළිතුර

ටෝරියම් අයන් සහ ස්ටීල් ආයතනය හසුරුවනු ලැබුවේ ඉහළ මට්ටමේ කමිටුවක් මගිනි. ගල්අඟුරු සැපයීම මගින් හිඟ මුදල් පියවීමට ගැනුම්කරු කැමැත්ත ප්‍රකාශක තිබියදී පවා ණය ආපසු අයකර ගත නොහැකි බවට කමිටුව කල්පනා කර නොමැත. අප සතු තොරතුරුවලට අනුව හිඟ මුදල් පියවීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලයේ තීරණය ලබාගැනීම පිණිස ඉදිරිපත් කර ඇත. ලංකා නැව් සංස්ථාවෙන් (ටෝරියම් අයන් සහ ස්ටීන් කම්පැණි ලිමිටඩ්) අයවිය යුතු හිඟ මුදල අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, ටෝරියම් අයන් සහ ස්ටීල් කම්පැණි ලිමිටඩ් ආයතනය සමඟ සාකච්ඡා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාර සහ ලංකා ගල්අඟුරු සංස්ථාව යන ආයතන ඇතුළත් වන පරිදි සාමාජිකයින් 4 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදි. තවදුරටත්, වරාය සහ නාවික අමාත්‍යාංශය හරහා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලෙසට අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබාදී ඇති අතර එකී නිර්දේශ තවමත් ඉදිරිපත් නොමැත.

1.2(ඌ) සඳහා පිළිතුර : ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි.

i. **ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු ඊවිස්සී : රු. 578,678,686**

ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු ඊවිස්සී හි 2019.12.31 දිනට ඊවිස්සී බැරකම් අන්තර්ගත වේ. සමාගමේ අලෙවිය ප්‍රකාරව ඊවිස්සී සඳහා බැරකම කාර්තුවකට රු.මි. 12.5 කින් ඉක්මවා ගොස් ඇති අතර, එබැවින් ලංකා ගල්අඟුරු සමාගම ඊවිස්සී ගෙවිය යුතු තත්ත්වයට පත්ව ඇත. මෙම කාරණය 73 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාට ලක් කළ අතර, ඊසීවිස් පියවීම සඳහා අරමුදල් නිදහස් කරන ලෙස සිහිකැඳවීමක් ලබාදීම පිණිස ලං.වි.බ. මණ්ඩලයට ලිපියක් යැවීමට තීරණය කරන ලදි. ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ අදාල උධෘතය මෙයට අමුණා ඇත.

ii. **විවිධ ණයගැතියන් - රු. 18,075,802**

ඉහත මුදල, ආපසු ලබාගත නොහැකි රු. 17,839,949 ක්වූ ජා.ගො. බදු සහ PAL වලින් සමන්විත වන බට මූලික විමර්ශනවලදී අනාවරණය විය. මූලාශ්‍රය/මූලාරම්භය සොයා දැනගැනීම පිණිස තවදුරටත් විමර්ශනය කරමින් පවතී.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

iii. නොබල් රිසෝසස් ආයතනයෙන් අයවිය යුතු රු. 1,115,987 ක මුදල

නොබල් රිසෝසස් ආයතනය සඳහා රු. 85,887,776 ක බැර ශේෂයක් පවතින අතර, මෙය අප විසින් එකී ආයතනයට තිබෙන ණයගැති ශේෂයට එරෙහිව හිලව් කරනු ඇත.

iv. නොබල් රිසෝසස් වෙළඳ ණයහිමියන් - රු. 85,887,776

ණයවර ලිපියේ වලංගු කාලසීමාව ඉකුත්වීම හේතුකොට ගෙන මෙම ශේෂය ප්‍රධාන වශයෙන් නොබල් රිසෝසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ඉවත්කර ගන්නා ලද (under drawn) මුදලින් සමන්විත වේ.

v. ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ් වෙතින් අයවිය යුතු 50% ISGS ගාස්තු - රු. 8,048,531

2015/2016 කාලය තුළ නැව් 17 ක් සඳහා විසර්ජන තොටුපල (discharge port) ණයවර සමීක්ෂණ ගාස්තු (draft survey charges) ඇතුළත් කර ඇත. මෙයට අමුණා ඇත්තේ අත්සන් කරන ලද ගිවිසුම පදනම් කරගෙන මෙම ගෙවීම සිදුකරන ලෙස ලිබර්ටි කොමොඩිටිස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත 2019 වර්ෂයේදී යවන ලද විද්‍යුත් තැපැල් පණිවිඩයයි. මෙම කාරණය සම්බන්ධ බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

1.2(ව) සඳහා පිළිතුර

එක් එක් ගල්අඟුරු කාලය (coal season) සඳහා ගිණුම් තැබීම සිදුකරනු ලබන්නේ ලංකා ගල්අඟුරු සංස්ථාවේ දැනට පවත්නා ගිණුම් තැබීමේ ක්‍රමයට අනුකූලවය. 2021-21 කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අගය 2020 දෙසැම්බර් 31 දිනට ලං.වි.බ. මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂය ලෙස පෙන්වනු ලැබේ.

විගණනයේදී පෙන්නුම් කර ඇති පරිදි, වර්ෂය අවසානයේදී හිඟව පවතින ශුද්ධ ශේෂය අනාවරණය කර ඇතත් ලං.වි.බ. මණ්ඩලයෙන් හිඟව පවතින මුළු මුදල සහ ලැබූ අත්තිකාරම් වෙන වෙනම අනාවරණය කර නැත. ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබූ අත්තිකාරම් වෙන වෙනම අනාවරණය කිරීමට අපේක්ෂා කෙරේ.

1.2(ඒ) සඳහා පිළිතුර

මෙම ගෙවීම ලංකා නැව් සංස්ථාව මගින් මාකේටර් සිංගප්පූරු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත 2019 වර්ෂයේදී සිදුකර ඇති අතරඳ, මාකේටර්හි බැරකම සම්බන්ධ මූලාශ්‍රය/මූලාරම්භය සොයා දැනගැනීම පිණිස විමර්ශනය කරමින් පවති. ඒ අනුව අදාල සටහන් සීඑස්සී වෙත යවනු ඇත.

1.2(ඔ) සඳහා පිළිතුර

රු. 29,266,965 ක්වූ වැඩිපුර ගෙවීම් වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කරන ලද පහත සඳහන් ලේඛණ ඔබගේ සත්‍යාපනය කිරීම පිණිස ඉදිරිපත් කරමි.

- ස්ටාර් ලෝටස් මත අංක 1183769 දරණ 2016.11.09 දිනැති අවසන් රේගු ප්‍රකාශනය (Cusdec).
- අවසන් වැට් බදු ගණනය කිරීම
- 2021 පෙබරවාරි 10 දිනැති රේගු බදු ආපසු ගෙවීමට අවසන් වරට නිකුත් කරන ලද ලිපියේ පිටපතක්.

2.2.2 සඳහා පිළිතුර - නීති/නියෝග සඳහා යොමුව

2.2.2(අ)(i) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

i. මනාව පිළියෙල කළ බඳවා ගැනීමේ යෝජනාක්‍රමයක් සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් (SORP) ලංකා ගල්අඟුරු සංස්ථාව සතුව නොමැති හෙයින් ඉහත කී බඳවා ගැනීමේ යෝජනාක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය (SORP) කෙටුම්පත් කිරීම සඳහා අමාත්‍යාංශයෙන් එක් සාමාජිකයෙකු සහ ලං.වි.බ. මණ්ඩලයෙන් සාමාජිකයින් දෙදෙනෙකුද සීඑස්සී ආයතනයෙන් එක් සාමාජිකයෙකුද ලංකා ගල්අඟුරු සංස්ථාවෙන් එක් සාමාජිකයෙකුද

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ඇතුළත් වන පරිදි සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ලංකා ගල්අඟුරු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇත. ඒ අනුව එකී බඳවා ගැනීමේ යෝජනාක්‍රමයේ සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටියේ (SORP) කෙටුම්පත මේ වනවිට ඔවුන් විසින් පිළියෙල කර ඇති අතර එය ලංකා ගල්අඟුරු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. ලංකා ගල්අඟුරු සංස්ථාවේ නව බඳවා ගැනීමේ යෝජනාක්‍රමයට සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටියට (SORP) අනුමැතිය 79 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබාදෙන ලදි.

ii. 2018 සැප්තැම්බර් සිට 2020 ජූලි මස දක්වා කාලය තුළ කාර්යමණ්ඩලය වෙත ආපදා ණය ලබා නොදී ඇතත් ණය ආපසු අයකර ගැනීමේ පෙර චකිතු කරගැනීම් පදනම් කරගෙන එය අරමුදලක් ලෙස සලකන ලදි. 2020 ජූනි මස 10 වෙනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව ණය අයදුම්පතක් සමග නීතිඥවරෙයකු විසින් අනුමත කරන ලද ඇපකරුවෙකු ඉදිරිපත් කළහොත් අඩුවීමේ ශේෂය පදනම් කරගෙන 6% ක පොලී අනුපාතයක් යටතේ එක් සේවකයෙකුට රු. 350,000 ක උපරිම සීමාවකට යටත්ව ණය පහසුකමක් ප්‍රදානය කිරීමට ලංකා ගල්අඟුරු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි.

iii. පාවිච්චි නොකරන ලද අසනීප නිවාඩු වෙනුවෙන් රු. 1,418,274 ක මුදලක් මේ වනතෙක් සමාගම විසින් ගෙවා නොමැත. කෙසේ වෙතත් පාවිච්චි නොකරන ලද අසනීප නිවාඩු සඳහා ගෙවීම් සිදුකිරීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් ලංකා ගල්අඟුරු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ඇතිව ඉල්ලීම් ලිපියක් බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එකී ලිපියේ පිටපතක් මෙයට අමුණා ඇත.

2.2.2(අ)(ii) - අංක පීඊඩී 05/2016 දරන 2016 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

ලංකා ගල්අඟුරු සංස්ථාව සිය මෙහෙයුම් කටයුතු අවම සේවක සංඛ්‍යාවකින් සිදුකර ඇති අතර ඉහළ අභියෝගාත්මක පාරිසරික තත්ත්ව යටතේ ලං.වි.බ. මණ්ඩලයට අවශ්‍ය කරනු ලැබූ ගල්අඟුරු සම්පූර්ණ ප්‍රමාණයම ලබාදීමට හැකිවී ඇත. කෙසේ වෙතත් ලං.වි.බ. මණ්ඩලය සහ ලංකා ගල්අඟුරු සංස්ථාව අතර ඇතිකරගත් ගිවිසුමේ අන්තර්ගත කොන්දේසි සහ නියමයන් යටතේ ලාභ අන්තයක් (profit margin) නොමැති නිසා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ලාභය මත ප්‍රමාණනය කළ නොහැකි විය. එබැවින් ලංකා ගල්අඟුරු සංස්ථාව සිය සේවකයින්ට ප්‍රසාද දීමනා ගෙවීමට අනුගමනය කළ ගෙවීම් පටිපාටියම යොදා ගනිමින් 2020 වර්ෂයේදීද ඔවුන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම බොහෝ සෙයින් සාධාරණීකරණය කළ හැකි අතර ප්‍රසාද දීමනා සඳහා වැය කළ යුත්තේ රු. 1,923,225/- ක මුදලක් පමණි. මේ සඳහා වෙන්කළ යුතු ප්‍රතිපාදනය වන රු. 2,445,996 ක මුදල 2020.02.19 වෙනි දින පවත්වන ලද 71 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණවල 03 වෙනි අයිතමය යටතේ 2020 වර්ෂය සඳහා අනුමත අයවැයෙන් ලබාදී ඇත. ලංකා ගල්අඟුරු සංස්ථාවේ සේවකයින් සඳහා ප්‍රසාද දීමනා මේ ආකාරයෙන්ම 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය තෙක් ගෙවා ඇත. එසේම මෙම මූල්‍ය වර්ෂයේ අවසන් මාස 9 (2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා) සඳහා පැටවුම් තොටුපළ ප්‍රමාද ගාස්තු ඩොලර් ගනුදෙනුවෙන් (Lord port demurrages Dollar transaction) හැසිරවීමේ ආදායම් වශයෙන් රු. 5,047,000 ක මුදල් ලංකා ගල්අඟුරු සංස්ථාව විසින් උපයා ඇත.

ඒ අනුව ලංකා ගල්අඟුරු සංස්ථාව පුද්ගලික සමාගමක් නිසා සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය 2020.11.30 වෙනි

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

දින පවත්වන ලද 77 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබාදී ඇත.

2.2.2 : ආ - විධිමත්ව සංශෝධනය කරන ලද 2016 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත

ගෙවිය යුතු ESC : 579,179,232

ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු ඊවිස්සී හි 2019.12.31 දිනට ඊවිස්සී බැරකමද අන්තර්ගත ය. සමාගමේ අළෙවියට අනුව ලං.වි.බ. මණ්ඩලයෙන් අයවිය යුතු ඊවිස්සී හි 2019.12.31 දිනට ඊවිස්සී බැරකම් අන්තර්ගත වේ. සමාගමේ අලෙවිය ප්‍රකාරව ඊවිස්සී සඳහා බැරකම කාර්තුවකට රු.මි. 12.5 කින් ඉක්මවා ගොස් ඇති අතර, එබැවින් ලංකා ගල්අඟුරු සමාගම ඊවිස්සී ගෙවිය යුතු තත්ත්වයට පත්ව ඇත. මෙම කාරණය 73 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ලක් කළ අතර, ඊසීවිස් පියවීම සඳහා අරමුදල් නිදහස් කරන ලෙස සිහිකැඳවීමක් ලබාදීම පිණිස ලං.වි.බ. මණ්ඩලයට ලිපියක් යැවීමට තීරණය කරන ලදි.

2.5 සඳහා පිළිතුර - අනිකුත් කරුණු

(අ) මෙම කාරණය සම්බන්ධයෙන් ලං.වි.බ. මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කර ඇති විමර්ශන වාර්තාවක් පදනම් කරගෙන පැහැදිළිවම චෝදනා කළ හැකි එක් නිලධාරියෙකු හඳුනාගනු ලැබීය. ආයතන සංග්‍රහයේ II වෙනි කොටසේ XLVII පරිච්ඡේදයේ 29.4 වෙනි වගන්තිය යටතේ ඔහුට අධිචෝදනා නිකුත් කරන ලදි. චෝදනා පත්‍රයේ සඳහන් සියලුම චෝදනාවලට වැරදිකරු බවට ඔහු පිළිගත්තේ ය. එබැවින් උපලේඛන අංක 1 යටතේ ඔහු විසින් සිදුකරන ලද වැරදිවලට දඩුවම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ඇතිව ලබාදී ඇත. වාර්තාව පදනම් කරගෙන විධිමත් චෝදනා ගොනු කිරීම පිණිස මෙයට සම්බන්ධ අනිකුත් නිලධාරීන්ද හඳුනාගැනීම පිණිස මූලික විමර්ශනයක් දියත් කර ඇත. මෙම කාර්යය පිණිස ආයතන සංග්‍රහයේ II වෙනි කොටසේ XLVII පරිච්ඡේදයේ 29.4 සහ 29.3 වගන්ති යටතේ 2021 අප්‍රේල් මස 24 වෙනි දින මූලික විමර්ශන නිලධාරියෙකු පත්කර ඇත.

(ආ) බඳවා ගැනීමේ යෝජනාක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය (SOR) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන තෙක් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට ප්‍රතිපාදන නොමැත. එබැවින් ඉදිරි මාස තුන ඇතුළත සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වන පුරප්පාඩුව පිරවීමට කළමනාකරණය විසින් තීරණයක් ගෙන ඇත.

සීමාසහිත ලංකා ගල්අඟුරු සංස්ථාව

.....

බී.කේ. ජගත් පෙරේරා
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ

ගිණුම්කරණ සටහන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	10	10,117,801	3,258,235
අනිකුත් ජංගම නොවන වත්කම්	11	775,977,718	775,977,718
		786,095,520	779,235@953
ජංගම වත්කම්			
අයවිය යුතු වෙළඳ සහ අනිකුත්	12	5,137,701,597	2,283,685,359
ආපසු ගෙවන තැන්පතු	13	117,000	117,000
මූල්‍ය වත්කම්	14	-	-
කර්යමණ්ඩලය සඳහා ණය	15	5,053,666	4,458,530
අයවිය යුතු බදු	16	608,885,773	605,935,265
බැංකුවේ තිබෙන මුදල් සහ අත ඇති මුදල්	17	8,505,432	4,289,552
		5,760,263,468	2,898,485,706
මුළු වත්කම්		6,546,358,988	3,677,721,659
සමකොටස් සහ බැරකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	20,000,000	20,000,000
රඳවාගත් ඉපැයුම්		86,969,282	79,094,282
		106,969,282	99,094,282
ජංගම නොවන බැරකම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	19	4,441,920	3,949,203
අනිකුත් ජංගම නොවන බැරකම්	20	714,965,434	714,965,434
		719,407,354	718,914,637
ජංගම බැරකම්			
ණයහිමියන් සහ අනිකුත් ගෙවිය යුතු	21	5,711,500,524	2,850,225,400
උපචිත වියදම්	22	2,251,281	3,442,700
ගෙවිය යුතු ආදායම් බදු	23	6,230,547	6,044,641
		5,719,982,352	2,859,712,740
මුළු බැරකම්		6,439,389,706	3,578,627,377
මුළු සමකොටස් සහ බැරකම්		6,546,358,988	3,677,721,659

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි

බී.ඒ.ඒ. කුමාර
මූල්‍ය කළමනාකාර

මෙම මූල්‍ය ප්‍රකාශල පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරමු.

අධ්‍යක්ෂකගේ නම	සභාපති/අධ්‍යක්ෂ	අත්සන
බී.කේ. ජගත් පෙරේරා	සභාපති අධ්‍යක්ෂ	

2021 පෙබරවාරි 25
කොළඹ

මූල්‍ය කාර්යසාධන සහ අනිකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම	4	41,000,383,219	42,470,160,495
සෘජු වියදම් (විකුණුම් පිරිවැය)	5	(40,954,618,074)	(42,414,953,867)
දළ ලාභය		45,765,145	55,206,627
අනිකුත් ආදායම්	6	1,838,455	7,973,701
පරිපාලන පිරිවැය		(53,836,714)	(65,288,550)
මෙහෙයුම්වලින් ලද ලාභය		(6,233,114)	(2,108,222)
මූල්‍ය ආදායම්	7	6,316,381	2,359,475
මූල්‍ය පිරිවැය		(83,267)	(251,253)
බදුබලට පෙර ලාභය	8	-	-
ආදායම් බදු වියදම්	9	-	-
වර්ෂය සඳහා ලාභය		-	-
අනිකුත් විසර්තීර්ණ ආදයම්		-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-

සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	රඳවාගත් ඉපැයුම් රු.	එකතුව රු.
2018.01.01 දිනට ශේෂය	20,000,000	50,526,319	70,526,319
වර්ෂය සඳහා ලාභය	-	-	-
අනිකුත් විස්තීර්ණ ආදායම්	-	-	-
පෙර වර්ෂයේ ගැළපීම්		28,567,962	28,567,962
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		28,567,962	28,567,962
2018.12.31 දිනට ශේෂය	20,000,000	79,094,282	99,094,282
2019 වර්ෂය සඳහා ලාභය	-	-	-
අනිකුත් විස්තීර්ණ ආදායම්	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	-
2020.01.01 දිනට ශේෂය	20,000,000	79,094,282	99,094,282
2020 වර්ෂය සඳහා ලාභය	-	-	-
අනිකුත් විස්තීර්ණ ආදායම්	-	-	-
මෝටර් රථ ප්‍රත්‍යාගණනයේදී සිදුවූ ප්‍රත්‍යාගණන ලාභය/ (පාඩුව)	-	7,875,000	7,875,000
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	7,875,000	7,875,000
2020.12.31 දිනට ශේෂය	20,000,000	86,969,282	106,969,282

ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් සාදයි
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිත)/මුදල් ගැලීම		
ආදායම් බදු වියදම්වලට පෙර ශුද්ධ ලාභය	-	-
පහත දැක්වෙන කාර්යයන් සඳහා ගැලපීම්		
ක්ෂය කිරීම්	1,591,273	1,820,290
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	944,817	1,258,603
මූල්‍ය ආදායම්	(6,316,381)	(2,359,475)
මූල්‍ය පිරිවැය	83,267	251,253
අනිකුත් ආදායම්	(6,705)	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	(3,703,729)	970,672
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්,		
වෙළඳ සහ අනිකුත් අයවිය යුතු හි (අඩුවීම)/වැඩිවීම	(2,854,016,238)	2,399,449,578
තැන්පතුවල (අඩුවීම)/වැඩිවීම	-	10,433
කාර්යමණ්ඩලය සඳහා ණය හි (අඩුවීම)/වැඩිවීම	(595ළ136)	2,656,574
අත්තිකාරම් ගෙවීම්වල (අඩුවීම)/වැඩිවීම	(2,950,508)	(312,844,959)
ණයහිමියන්ගේ අඩුවීම/(වැඩිවීම)	2,861,275,124	(2,168,661,823)
උපචිත වියදම්වල අඩුවීම/(වැඩිවීම)	(1,191,418)	(4,835,021)
මෙහෙයුම්වලින් (භාවිත)/උත්පාදනය කරන ලද මුදල්	(1,181,905)	(83,254,547)
අඩුකළා :		
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(83,267)	(251,253)
පෙර වර්ෂයේ ගැලපීම්	-	-
ගෙවන ලද පාරිතෝෂික	(452,100)	-
ගෙවන ලද ආදායම් බදු	-	(94,776)
ආදායම් බදු ගැලපීම්	185,906	442,388
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිත)/උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්	(1,531,366)	(83,158,188)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම්		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	(575,840)	(179,076)
අනිකුත් ආදායම්	6,705	-
පොලී ආදායම්	6,316,381	2,359,475
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිත) උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්	5,747,246	2,180,399

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් සහ මුදල් සමාන හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	4,215,880	(80,977,790)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන අයිතම	4,289,552	85,267,342
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන අයිතම	8,505,432	4,289,552
මුදල් සහ මුදල් සමාන අයිතම විශ්ලේෂණය කිරීම		
බැංකුවේ තිබෙන මුදල් - වාසිදායක	8,505,432	4,289,552
අත ඇති මුදල්	-	-
බැංකුවේ සහ අත ඇති මුදල්	8,505,432	4,289,552
කෙටිකාලීන ආයෝජන	-	-
	8,505,432	4,289,552

සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

වාර්තා කරනු ලබන අස්ථිත්‍යය

1.1 ස්ථාපනය සහ නෛතික ආකෘතිය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 ජනවාරි මස 01 වෙනි දින සංස්ථාපනය කරන ලද සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පරිශ්‍ර අංක 51/3, දුටුගැමුණු මාවත, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇත

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය වෙත (LVVP) කාලසීමාව තුළ සම්පාදනය කිරීම ය. ලංකා ගල්අඟුරු සංස්ථාව මෙම බැඳීම සිය පැවැත්ම පුරාවට උද්යෝගීමත්ව සපුරාලමින් සිටී. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ සිට ලක්විජය ගල්අඟුරු බලාගාරයේ (Jetty) ජැටිය දක්වා ගල්අඟුරු ලබාදීම දක්වා වන සියලුම ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ලංකා ගල්අඟුරු සංස්ථාව මගින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල්ව වර්ග කළ හැකිය.

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ටෙන්ඩර් පිරිසැකසුම් කිරීම සහ ප්‍රදානය කිරීම.
2. ණයවර ලිපි විවෘත කිරීම, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව සහ බැංකුකරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම සහ බැංකු පහසුකම් සහ ලිපි ලේඛන විධිමත් කිරීම.
3. ප්‍රවර්ධන, ප්‍රවාහවය සහ බත්තල් සේවා.
4. ගැනුම්කරු (LVVP), සැපයුම්කරුවන්, පර්යන්ත ක්‍රියාකරුවන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ලංකා නැව් සංස්ථාව ආදිය සමග සම්බන්ධතා පැවැත්වීම සහ පරදුදරන්නන් අතර විවිධ ක්‍රියායාරකම් සම්බන්ධීකරණය.

වර්ෂය අවසානය වනවිට සමාගමේ සාමාන්‍ය සේවක සංඛ්‍යාව 23 ක් විය.

1.3 මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම 100% ක්ම රජයට අයත් අස්ථිත්‍යයක් වන අතර අත්‍යන්ත මව් කළමනා සහ පාලන පාර්ශවය වන්නේ සමාගම සංස්ථාපනය කිරීමේ සිට එහි පරදුවලින් 60% අයත් ලංකා විදුලිබල මණ්ඩලය ය. ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපනය කරන ලද්දේ 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේය.

1.4 අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිකුත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසරය 2021 පෙබරවාරි මස 25 වෙනි දින අධ්‍යකෂ මණ්ඩලය විසින් ලබාදෙන ලදි.
අංක 15 සිට 24 දක්වා පිටුවල දැක්වෙන සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මූල්‍ය තත්ත්වය, ලාභ හෝ පාඩු සහ අනිකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ගැලීමේ ප්‍රකාශනය යන අංගවලින් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ ඒ සඳහා සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කොට ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLFRSs and LKASs) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කොට ඇති අතර අවශ්‍ය පරිදි යෝග්‍ය අනාවරණය කිරීම් සපයා ඇත.

වර්ෂය තුළ අනුගමනය කරන ලද සුවිශේෂී ගිණුම් පිළිවෙත් අංක 3.1 සිට 3.14 දක්වා සටහන්වල

දක්වා ඇත. අදාල SLFRSs and LKASs, www.casrilanka.com දරණ වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ එහි දක්වා ඇති අනාවරණය කිරීම් පෙර අනුගමනය කරන ලද ඉදිරිපත් කිරීම්වලට අනුකූල වේ. ආදායම් ප්‍රකාශනය, සටහන් අංක 3.8.1 හි විස්තර කර ඇති 2017 වර්ෂයෙන් ආරම්භවී උපයෝගී කරගනු ලැබූ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියෙන් සමන්විත වේ.

2.2 ඇගයීමේ පදනම

වෙනත් හැටියකින් සඳහන් කර ඇතිනම් මිසක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ ය.

2.3 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ සමාග මේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලිනි. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටකර ඇත.

2.4 වාස්තවික බව සහ සමූහනය

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් - LKAS 1 ට අනුකූලව, (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ ක්‍රියාවන්ද ඒවා ද්‍රව්‍යාත්මක නොවේ නම් මිසක වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන්නේ හඳුනාගත් වටිනාකම් හිලව් කිරීමට නීති ප්‍රකාරව බලාත්මක අයිතියක් තිබෙන විට සහ ශුද්ධ පදනම මත හිලව් කිරීමට හෝ වත්කම උපලබ්ධි කිරීමට සහ ඒ සමගම බැරකම හිලව් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණි.

ගිණුම් ප්‍රමිතියකින් අවශ්‍ය කරනු ලබන්නේ නම් හෝ අවසර දී ඇත්නම් මිසක ආදයම් සහ වියදම් නිශ්චය කිරීමේදී ඒවා හිලව් කරන්නේ නැත.

2.5 ගිණුම් පිළිවෙත්, වෙනස්කම් සහ සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් අදාල කරගනු ලැබූ ගිණුම් පිළිවෙත් වෙනත් හැටියකින් සඳහන් කර නොමැති නම් මිසක පෙර වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් පිළිවෙත්වලට අනුරූප වේ. ආදායම සහ විකුණුම් පිරිවැය සඳහා ගිණුම් හැසිරීම 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රතිපත්තිය පරිදි ගැනුම්කරුවෙකුගේ සහ විකුණුම්කරුවෙකුගේ ආදායමට සහ විකුණුම් පිරිවැයට අනුකූල වේ. මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලවීම පිණිස පෙර වර්ෂයේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය අවස්ථාවලදී නැවත සකස් කර ඇත.

2.6 ඇස්තමේන්තු, තීන්දු සහ උපකල්පන භාවිතා කිරීම

ගිණුම් පිළිවෙත් සහ වත්කම් - බැරකම්, අදායම් සහ වියදම් - වත්කම්, බැරකම්, ආදයම් සහ වියදම්වල වාර්තාගත වටිනාකම් - වාර්තා කරනු ලබන දිනට අසම්භාවී බැරකම් අදාල කරගැනීමට බලපාන කළමනාකරණය විසින් තීන්දු ගැනීමට, ඇස්තමේන්තු කිරීමට සහ උපකල්පනයන් කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS ට අනුකූලව පිළියෙල කළ යුතු වේ. තථ්‍ය ප්‍රතිඵල එකී ඇස්තමේන්තු සහ විනිශ්චයාත්මක තීරණවලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පෙනෙන්නට තිබෙන උපකල්පන සමාලෝචනය කරනු ලබන්නේ ඉදිරිය යන පදනම මත ය. ගිණුම් ඇස්තමේන්තුවලට සිදුකරන ලද සංශෝධන හඳුනාගනු ලබන්නේ සංශෝධනය කිරීම එම කාලපරිච්ඡේදයට පමණක්

හෝ සංශෝධනය කරනු ලැබූ කාලපරිච්ඡේදයට සහ අනාගත කාලපරිච්ඡේදයට පමණක් හෝ වර්තමාන සහ අනාගත යන කාලපරිච්ඡේද දෙකටම පමණක් බලපාන්නේ නම් - ඇස්තමේන්තු සංශෝධනය කරනු ලැබූ කාලපරිච්ඡේදය තුළදී ය.

2.7 ශේෂ පත්‍රයේ දිනට පසුව හටගන්නා අවස්ථා

සියලුම ද්‍රව්‍යාත්මක පසු ශේෂ පත්‍ර අවස්ථා සැලකිල්ලට ගෙන ඇති අතර යෝගය ගැලපීම් හෝ අනාවරණය කිරීම් අනුපිළිවෙල සටහන්වල එනම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 25 සිදුකර ඇත.

2.8 ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීම්

අස්ථිත්‍යයක් ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීම් වත්කම්, බැරකම් හෝ සමකොටස්වල වෙනස්වීම් හටගැනීමට හේතුවන අවස්ථා හැර බලපානු ලබන කාලපරිච්ඡේදය තුළ (වෙනස්වීම සිදුවන කාලපරිච්ඡේදය සහ අදාල වන්නේ නම් අනාගත කාලපරිච්ඡේදයන්) ලාභයට හෝ පාඩුවට සිදුවන බලපෑම ඇතුළත් කරමින් පෙරදිසි ලෙස හඳුනා ගනී. මේ අවස්ථාවේදී එය අදාල වත්කමේ, බැරකමේ හෝ වෙනස්වීම සිදුවන කාලපරිච්ඡේදයේ සමකොටස්වල ධාරණ අගය ගලපමින් හඳුනාගනු ලැබේ.

3. සුවිශේෂී ගිණුම් පිළිවෙත්

3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මුදල් වන අතර සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී හෝ ශේෂ පත්‍රයේ දින සිට එක් වසරක් තුළ යන කාලපරිච්ඡේද දෙකින් වඩාත් කෙටි කාලයක් තුළ මුදල් වලින් උපලබ්ධිවීමට අපේක්ෂා කරන වත්කම් වේ. ජංගම වත්කම් හැර අනිකුත් වත්කම් එනම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට එක් වසරක කාලපරිච්ඡේදයකට වඩා ගිය කාලපරිච්ඡේදයක් දරා සිටීමට සමාගම අපේක්ෂා කරන වත්කම් වේ.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලබන්නේ පිරිවැය අඩු සමුච්චිත ක්ෂය කිරීම සහ යම් සමුච්චිත අපහානයන අගය මත ය. දේපළ, පිරියත සහ උපකරණයක පිරිවැය, එය මිළට ගැනීමට වැය කළ මුදල සහ එකී වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන තත්ත්වයට ගෙන ඒමට වැය කළ සෘජුවම ආදේශ කල හැකි යම් පිරිවැයකින් සමනවිත වේ.

ස්වයං-නිර්මිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු කම්කරු, සහ වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන තත්ත්නයට ගෙන ඒමට වැය කළ සෘජුවම ආදේශ කළ හැකි යම් වෙනත් පිරිවැය ඇතුළත් වේ. මෙයට අයිතමය ගැලවීමට සහ ඉවත් කිරීමට සහ ඒවා ස්ථානගත කරනු ලබන වැඩබිමේදී ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී දැරීමට සිදුවූ පිරිවැයද ඇතුළත් වේ.

යම් හෙයකින් වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ධාරණ අගය වැඩි වන්නේ නම් එකී වැඩිවීම එකී වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ පවත්නා යම් බැර ශේෂයක ප්‍රමාණයට ප්‍රත්‍යාගණන සංචිත ශීර්ෂය යටතේ සෘජුවම සමකොටස්වලට හරකළ යුතුය.

දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගයන් ආපසු අයකර ගත නොහැකි බවට අවස්ථා හෝ තත්ත්වයන්ගේ වෙනස්කම් පෙන්වන විටෙකදී එකී ධාරණ අගයන් අපහායනය කිරීම සඳහා සමාලෝචනය කරනු ලැබේ.

3.2.1 තදනන්තර පිරිවැය (Subsequent cost)

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ එකී කොටසින් මූර්තිමක් කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ලැබීම සසම්භාවී නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් එකී අයිතමයේ ධාරණ අගයේය.

